# පුරවැසි අධ්‍යාපනය

# 11 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

**මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

# පුරවැසි අධ්‍යාපනය

## ගුරු මාර්ගෝපදේශය
## 11 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය හා බෙදාහැරීම : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පුරවැසි අධ්‍යාපනය
11 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : infor@nie.lk

මුද්‍රණය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නො.2/60, රවුම් පාර, දිවුලපිටිය පිහිටි සරස්වතී ප්‍රකාශන ආයතනයේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව ගුරුවරුන් නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.

- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම, (ඉගෙනීම ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස්ගේ කියමන සිහියට නගා ගන්න. ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.

- ඉගෙනුම් වාතාවරණය ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.

- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූලව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබා දීම ය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණයේ හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව

- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය

- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත් පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදි වශයෙන්) අවසානයත්, මාර්ගයත් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු, ඒකක ආදි වශයෙන්) තොරතුරු සොයා බලා ලබා ගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂම ව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිනුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට ඉගැන්වීමේ දීත් ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනය කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

**මහාචාර්ය ගුණපාල නානායක්කාර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම.**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙදා හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සඳ කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**තිස්ස හේවාවිතාන**
**අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්**
**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**
**ඉසුරුපාය,**
**බත්තරමුල්ල.**
**2015.09.22**

## උපදේශකත්වය හා අනුමැතිය

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

## සම්බන්ධීකරණය

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## ලේඛක මණ්ඩලය (බාහිර)

| | |
|---|---|
| සී.එස් ජයසිංහ | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික), හොරණ |
| පී.ඩී. සෝමාවතී | ගුරු උපදේශිකා (විශ්‍රාමික)<br>බුලත්සිංහල |
| පී.පී. මාලිකා | ගුරු උපදේශිකා<br>හම්බන්තොට |
| එම්.කේ කිංස්ලි ප්‍රියන්ත | කථිකාචාර්ය<br>රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වලහන්දුව, ගාල්ල |
| එම්.එච්.එම්. යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| කේ.ඒ.එන්. පුෂ්පකුමාර | ගුරු සේවය<br>පොලේගොඩ ම.වි, මහගම |
| ආචාර්ය ශාමින්ද වනසිංහ | කථිකාචාර්ය<br>අධ්‍යාපන පීඨය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ |
| නීතිඥ වසන්තා සෙනෙවිරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>පොදු හා අන්තර්ජාතික නීති අධ්‍යයන අංශය<br>නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |

## ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්.යූ.අයි.කේ ද සිල්වා | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්. කරුණාකරන් | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## භාෂා සංස්කරණය

| | |
|---|---|
| එච්.පී. සුසිල් සිරිසේන | කථිකාචාර්ය<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට 10 -11 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක වූ පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය විෂය 2015 වර්ෂයේ සිට පුරවැසි අධ්‍යාපනය නමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව 6 - 9 ශ්‍රේණි දක්වා පුරවැසි අධ්‍යාපනය විෂය අනිවාර්ය විෂයක් ලෙසත්, 10 - 11 ශ්‍රේණි සඳහා පළමුවන විෂය කාණ්ඩයේ තෝරාගත හැකි විෂයක් ලෙසත් ක්‍රියාත්මක වේ. 10 -11 ශ්‍රේණි සඳහා මෙම විෂයය ඉගැන්වීමට සතියකට කාල පරිච්ඡේද තුනක් වෙන් කර ඇත. අ.පො.ස. (සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම් සිදු කිරීමට යෝජිත ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පහසු කර ගැනීම සඳහා ගුරු අත්පොතට ඇතුළත් කර ඇති විෂය අන්තර්ගතය ආවරණය වන පරිදි ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පංති කාමර අවශ්‍යතාව අනුව ක්‍රියාකාරකම් සංවර්ධනය කර ප්‍රයෝජනයට ගැනීමට ඔබට නිදහස ඇත. මෙහි දී 2007 වර්ෂයේ නිකුත් කරන ලද 11 වන ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජාපාලනය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ද භාවිත කළ හැකි ය.

පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදා ගන්නා ක්‍රමවේද ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්යභාරය පහසුකර ගැනීමට අවශ්‍ය පරිදි පෙළ පොත භාවිතයට ගැනීම ද අත්‍යවශ්‍ය වේ.

11 වන ශ්‍රේණියට අදාළ මෙම පුරවැසි අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීමේ දී එක් එක් නිපුණතාවට, නිපුණතා මට්ටමට අදාළ ව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල සාක්ෂාත් කරගත හැකි පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කිරීමේ දී ආවරණය කළ යුතු විෂය කරුණු අවශ්‍ය උදාහරණ සහිත ව දක්වා ඇත. ගුරු අත්පොත භාවිතයට ගැනීමේ දී එක් එක් මතෘකාවට සමගාමී ව පෙළ පොතෙහි ඇතුළත් කර ඇති කරුණු හා ක්‍රියාකරකම් ද සැලකිල්ලට ගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි ඇතුළත් කර ඇති ගුණාත්මක යෙදවුම් උදාහරණ වන අතර අවශ්‍ය පරිදි ඒවා වෙනස් කර ගැනීමේ නිදහස තිබේ.

පුරවැසි අධ්‍යාපනය විෂයයේ අරමුණු ඉටු වන පරිදි අවම වශයෙන් 50% ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමු. එක් එක් අපේක්ෂිත විෂය අරමුණු ඉටුකර ගැනීම සඳහා ශිෂ්‍ය පාර්ලිමේන්තුව ඵලදායී ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න. මෙම ගුරු මාර්ගෝපදේශය සම්බන්ධ සංවර්ධනාත්මක යෝජනා වෙතොත් අප වෙත යොමු කරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

ව්‍යාපෘති කමිටුව

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii – iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | v |
| පෙරවදන - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය | vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x-xxix |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-58 |
| 11.1 නීතිය හා යුක්තිය | 02-13 |
| 11.2 ආණ්ඩුවේ විවිධ ස්තර | 14-25 |
| 11.3 මානව හිමිකම් | 26-35 |
| 11.4 පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය | 36-48 |
| 11.5 ජාත්‍යන්තර සබඳතා | 49-57 |
| විවිධ සහාය | 58 |

# පුරවැසි අධ්‍යාපනය

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

**(2016 සිට ක්‍රියාත්මක වේ)**

# හැඳින්වීම

ප්‍රථම වරට පාසල් විෂයමාලාවට පුරවැසි අධ්‍යාපනය විෂය හඳුන්වා දීම 2005 වර්ෂයේ දී සිදු කරනු ලැබීය. එහි දී 6 - 11 ශ්‍රේණි සඳහා අනිවාර්ය විෂයක් ලෙස පුරවැසි අධ්‍යාපනය විෂය හඳුන්වා දෙනු ලැබුවත්, 2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම විෂය 6 - 9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය ලෙසත් 10 - 11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය ලෙසත් විෂයේ නම වෙනස් කරන ලදී.

මෙසේ විෂය ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටලු හා ඒ වන විට කර තිබූ පර්යේෂණ අනාවරණ, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් හා ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ අදහස් ආදිය ද සලකා බලා නැවත වරක් 6 - 11 ශ්‍රේණි සඳහා එක ම විෂයක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව 2015 වර්ෂයේ සිට පුරවැසි අධ්‍යාපනය නමින් 6 - 11 ශ්‍රේණි සඳහා මෙම විෂය ක්‍රියාත්මක කෙරේ. 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකකුත්, 10 - 11 ශ්‍රේණි සඳහා පළමු කාණ්ඩයේ විෂයක් ලෙස සතියකට කාල පරිච්ඡේද තුනකුත් මෙම විෂය සඳහා වෙන් කර ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

# පුරවැසි අධ්‍යාපනය 6-11 ශ්‍රේණි විෂය අරමුණු

01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනගා ගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම

03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමග එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

04. නිරතුරු ව වෙනස්වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

05. බහුවිධ සමාජයක් තුළ එක්සත්බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංග හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම

06. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැගීම

07. ආපදා කළමනාකරණයට සක්‍රිය ව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදු වන හානි අවම කර ගැනීම

08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම

09. විවිධ ආර්ථික න්‍යායන් හා විවිධ ආර්ථික මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම

10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැගීම

11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම

12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීම මගින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **නීතිය හා යුක්තිය**<br>11.1 නීතිගරුක පුරවැසියෙකු ලෙස ජීවත් වෙයි. | 11.1.1 විවිධ නීති වර්ග හා ඒ එක එකකට අදාළ ව රාජ්‍යයේ භූමිකාව විමර්ශනය කරයි. | • "නීතිය" නිර්වචනය කිරීම හා හැඳින්වීම.<br>• විවිධ නීති වර්ග හා ඒ එක එකකට අදාළ ව රාජ්‍යයේ භූමිකාව<br>* දේශීය නීතිය<br>* අන්තර්ජාතික නීතිය | • නිර්වචන ඇසුරින් නීතිය හඳුන්වයි.<br>• දේශීය නීතිය අර්ථ දක්වයි.<br>• අන්තර්ජාතික නීතිය විස්තර කරයි<br>• විවිධ නීති වර්ගවලට අදාළ ව රාජ්‍යයේ භූමිකාව පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි. | 04 |
| | 11.1.2 ශ්‍රී ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතිය හා එහි වර්ධනය විශ්ලේෂණය කරයි. | • වත්මන් අධිකරණ පද්ධතිය හා එහි ඓතිහාසික වර්ධනය<br>• අධිකරණ වර්ග, ඒවායේ බලතල හා කාර්ය<br>* ශ්‍රේෂ්ඨාධිකරණය<br>* අභියාචනාධිකරණය<br>* පළාත්බද මහාධිකරණය<br>* මහාධිකරණය<br>* දිසා අධිකරණය<br>* මහේස්ත්‍රාත් අධිකරණය | • වත්මන් අධිකරණ පද්ධතියෙහි ඓතිහාසික වර්ධනය පැහැදිලි කරයි.<br>• වත්මන් අධිකරණ පද්ධතියට අයත් අධිකරණ වර්ග නම් කරයි.<br>• වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යයන් විස්තර කරයි.<br>• වත්මන් අධිකරණ පද්ධතියට අයත් අධිකරණ වර්ග පිළිබඳ විස්තර ගොනු කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | | • වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යයන් පිළිබඳ තොරතුරු දැන ගැනීම යහජීවනයට හේතුවන බව පිළිගනිමින් අදහස් දක්වයි. | |
| | 11.1.3 නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන්ගේ කාර්යභාරය විමර්ශනය කරයි. | • අධිකරණ ඇමති<br>• අග්‍රවිනිශ්චයකාරවරයා<br>• නීතිපති | • අධිකරණ ඇමැතිවරයාගේ කාර්යභාරය සාකච්ඡා කරයි.<br>• අග්‍රවිනිශ්චයකාරවරයාගේ කාර්යභාරය විස්තර කරයි.<br>• නීතිපතිවරයාගේ කාර්යභාරය පැහැදිලි කරයි. | 02 |
| | 11.1.4 ආරවුල් විසඳීම සඳහා වන විකල්ප ක්‍රම පිරික්සයි. | • ආරවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම හඳුන්වා දීම<br>* උපදේශනය<br>* සමථකරණය<br>* බේරුම්කරණය<br>* ඔම්බුඩ්ස්මන්<br>* මානව හිමිකම් කොමිසම | • ආරවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම නම් කරයි.<br>• ආරවුල් සාමකාමී ව විසඳා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.1.5 නීතියේ ආධිපත්‍යය සහ අප්‍රමාද ව හා අපක්ෂපාතී ව යුක්තිය පසිඳලීමේ වැදගත්කම අගය කරයි. | • නීතියේ ආධිපත්‍ය හැඳින්වීම<br>• අධිකරණයේ ස්වාධීනත්වය හැඳින්වීම හා එහි ඇති වැදගත්කම<br>• අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර<br>• අප්‍රමාද ව හා අපක්ෂපාතී ව යුක්තිය පසිඳලීමේ වැදගත්කම<br>• නීතිගරුක පුරවැසියෙකු ලෙස ජීවත් වීමේ වැදගත්කම | • නීතියේ ආධිපත්‍යය යන්න අර්ථ දක්වයි.<br>• අධිකරණයේ ස්වාධීනත්වය යනු කුමක් දැ යි විස්තර කරයි.<br>• අධිකරණයේ ස්වාධිනත්වයේ ඇති වැදගත්කම අගය කරයි.<br>• අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර විස්තර කරයි.<br>• නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත් වීමේ වැදගත්කම අගය කරමින් අදහස් ඉදිරිපත් කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ආණ්ඩුවේ විවිධ ස්තර**<br><br>11.2 ආණ්ඩුවේ විවිධ ස්තරවල භූමිකා පිළිබඳ ව විමර්ශනය කරමින් වගකීමෙන් යුතු පුරවැසියෙකු ලෙස ජීවත්වීමට පෙලඹෙයි. | 11.2.1 මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල විකාශනය විශ්ලේෂණය කරයි. | • පෙර පැවති තත්ත්ව හා වර්තමාන ව්‍යුහ හඳුන්වා දීම<br>• ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු<br>• බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු | • මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ඓතිහාසික විකාශනය විස්තර කරයි.<br>• මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කිරීමට හේතු විස්තර කරයි.<br>• ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු පැහැදිලි කරයි. | 04 |
| | 11.2.2 මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයන් පැහැදිලි කරයි. | • මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහය, බලතල හා කාර්යයන්<br>• පළාත් සභාවල ව්‍යුහය, බලතල හා කාර්යයන්<br>• පළාත් පාලන ආයතනවල ව්‍යුහය, බලතල හා කාර්යයන් | • මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ව්‍යුහය, බලතල හා කාර්යභාරය සාකච්ඡා කරයි.<br>• ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ ක්ෂේත්‍රයන්හි බලතල හා කාර්යයන් පිළිබඳ දැනුවත් වීම පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයට වැදගත්වන බව පිළිගනිමින් අදහස් දක්වයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.2.3 වත්මන් ව්‍යූහයන්හි සංවර්ධනාත්මක වෙනස්කම් අගය කරයි | • පළාත් සභාවල අවශ්‍යතාව සහ ඵලදායි බව<br>• පළාත් පාලන ආයතනවල අවශ්‍යතාව සහ ඵලදායි බව<br>• පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා වගවීම්<br>• ආණ්ඩුවේ විවිධ ස්තර කෙරෙහි පුරවැසියාගේ වගකීම් හා යුතුකම් | • පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ඵලදායිබව පිළිබඳ සාකච්ඡා කරයි.<br>• පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා පුරවැසියාගේ වගකීම් හා යුතුකම් ලැයිස්තු ගත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **මානව හිමිකම් හා යුතුකම්**<br>11.3 මානව හිතවාදී පුරවැසියෙකු ලෙස කටයුතු කරයි. | 11.3.1 මානව හිමිකම් සංකල්පය පැහැදිලි කරයි. | • මානව හිමිකම් නිර්වචනය කිරීම හා සංකල්ප හැඳින්වීම<br>• මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස හඳුනා ගැනීම | • මානව හිමිකම් සංකල්පය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>• මූලික අයිතිවාසිකම් විග්‍රහ කරයි.<br>• මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස හඳුනාගෙන ඒ පිළිබඳ විස්තර කරයි. | 02 |
| | 11.3.2 අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා විමර්ශනය කරයි. | • මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ගනු ලැබූ ප්‍රයත්න<br>* ක්‍රි.ව. 1215 - මැග්නා කාර්ටා පනත<br>* ක්‍රි.ව. 1679 - හබයාස් කෝපුස් ආඥාව<br>* ක්‍රි.ව. 1689 - අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය<br>* ක්‍රි.ව.1776 - ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය | • මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධ වැදගත්වන ඓතිහාසික ප්‍රයත්න පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• මානව අයිතිවාසිකම් පිළිබඳ පුළුල් වශයෙන් අවධානය යොමු වූ හේතු පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | * ක්‍රි.ව. 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය<br>* ක්‍රි.ව. 1917 - රුසියන් විප්ලවය<br>* ක්‍රි.ව. 1949 - චීන විප්ලවය<br>• මානව අයිතිවාසිකම් පිළිබඳ පුළුල් වශයෙන් සාකච්ඡා කිරීමට බලපෑ හේතු | | |
| | 11.3.3 එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කළ මානව හිමිකම් පිළිබඳ ලියවිලි විමර්ශනය කරයි. | • එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ලියවිලි හා ආරම්භක ප්‍රකාශනයෙන් අනතුරු ව හඳුන්වා දුන් අනෙකුත් ලියවිලි හැඳින්වීම<br>* එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය<br>* සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය<br>* ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය | • මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන් විසින් සම්මත කරගත් ප්‍රකාශන පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• CEDAW සම්මුතියේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.<br>• එක්සත් ජාතින් විසින් ළමා අයිතිවාසිකම් සුරැකීමට ගෙන ඇති පියවර විස්තර කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | * සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට අදාළ පළමුවන වෛකල්පික ගිවිසුම<br>* සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට අදාළ දෙවන වෛකල්පික ගිවිසුම<br>* කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW)<br>* ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (CRC) | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.3.4 මානව අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් පුරවැසි කාර්යභාරය අගය කරයි. | • අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් පුරවැසි කාර්යභාරය හා වගකීම<br>* මානව අයිතිවාසිකම්<br>* ළමා අයිතිවාසිකම්<br>* කාන්තා අයිතිවාසිකම්<br>* කම්කරු අයිතිවාසිකම්<br>* විශේෂ අවශ්‍යතා ඇති අයගේ අයිතිවාසිකම්<br>* පාරිසරික පැවැත්ම තහවුරු කිරීම සම්බන්ධයෙන් පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් | • මානව අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.<br>• ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා පුරවැසියකු වශයෙන් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.<br>• කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පුරවැසි යුතුකම් හා වගකීම් ඉටුකිරීමේ වැදගත්කම අගය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පාරිසරික පැවැත්ම තහවුරු කිරීම සඳහා පුරවැසියකු විසින් ඉටු කළ යුතු යුතුකම් පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.3.5 ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර විශ්ලේෂණය කරයි. | • ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථා ප්‍රතිපාදනවල වර්ධනය<br>• ශ්‍රී ලංකාවේ කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගෙන ඇති පියවර<br>• මානව හිමිකම් භුක්ති විඳීමේ වර්තමාන තත්ත්වය හා එහි සීමා<br>• මූලික අයිතිවාසිකම් හා පුරවැසි යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම | • ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරැකීම සඳහා සලසා ඇති ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන්හි විකාශනය පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලංකාවේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය**<br><br>11.4 පාරිසරික ගැටලු අවම කර ගනිමින් තිරසර සංවර්ධනයට දායක වෙයි. | 11.4.1 පරිසරය හා මිනිසා අතර සම්බන්ධතාව පැහැදිලි කරයි. | • පරිසරය නිර්වචනය කිරීම<br>• මිනිසා හා පරිසරය අතර ඇති අන්තර් සම්බන්ධතාව හඳුනා ගැනීම | • පරිසරය යන්න නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>• මිනිසා හා පරිසරය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි. | 02 |
| | 11.4.2 පරිසරයට ඇති තර්ජන හා ඒවායේ සමාජ බලපෑම පිළිගනියි. | • පාරිසරික ගැටලු හඳුනා ගැනීම<br>• එම ගැටලුවල සමාජ බලපෑම හඳුනා ගැනීම<br>* සම්පත් ක්ෂය වීම<br>* සම්පත් ක්ෂය වීම නිසා ඇතිවන ප්‍රතිඵල<br>* පරිසර දූෂණය<br>* පරිසර දූෂණය නිසා ඇතිවන ප්‍රතිඵල | • වත්මන් පාරිසරික ගැටලු හඳුනාගෙන ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• පාරිසරික ගැටලු කෙරෙහි වන සමාජ බලපෑම නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.<br>• පරිසර දූෂණය නිසා ඇතිවන ප්‍රතිඵල නිදසුන් දක්වමින් විස්තර කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.4.3 සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු හා ඒවාට විසඳුම් විශ්ලේෂණය කරයි. | • "සංවර්ධනය" සංකල්පය හඳුනා ගැනීම<br>• සංවර්ධනය මැනීම සඳහා භාවිත වන මිනුම් හැඳින්වීම<br>• සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවලට නිදසුන් හා ලක්ෂණ<br>• සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල් මුහුණපාන ගැටලු<br>• සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු හා විසඳුම් | • සංවර්ධන සංකල්පය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.<br>• සංවර්ධිත හා සංවර්ධන වෙමින් පවත්නා රටවල ලක්ෂණ වගුගත කරයි.<br>• සංවර්ධන ක්‍රියාවලියේ දී රටවල් මුහුණපාන ගැටලු විස්තර කරයි.<br>• සංවර්ධනය වෙමින් පවත්නා රටවල ගැටලු විසඳා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරයි. | 08 |
| | 11.4.4 තිරසර සංවර්ධනය උදෙසා පරිසරය සුරැකීමේ වැදගත්කම හඳුනා ගනිමින් පාරිසරික ගැටලුවලට විසඳුම් ගවේෂණය කරයි. | • "තිරසර සංවර්ධනය" සංකල්පය හැඳින්වීම<br>• තිරසර සංවර්ධනයේ වැදගත්කම<br>• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්<br>• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් විවිධ ආයතන හා සංවිධානවල වගකීම් හා යුතුකම්<br>• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් රජයේ වගකීම් හා යුතුකම් | • තිරසර සංවර්ධනය සංකල්පය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>• තිරසර සංවර්ධනයේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.<br>• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුද්ගල, රජයේ හා විවිධ සමාජ ආයතනවල වගකීම් හා යුතුකම් විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **ජාත්‍යන්තර සබඳතා** | | | | |
| 11.5 ලෝක සමාජයේ සාමාජිකයෙකු ලෙස ඵලදායි ව ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට දායක වෙයි. | 11.5.1 ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත්කම අගය කරයි. | • ජාත්‍යන්තර සම්බන්ධතාවල අර්ථය හා වැදගත්කම | • ජාත්‍යන්තර සම්බන්ධතා යන්න කෙටියෙන් පැහැදිලි කරයි.<br>• ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත්කම විස්තර කරයි. | 02 |
| | 11.5.2 ජාත්‍යන්තර සම්බන්ධතාවල වර්තමාන තත්ත්වය හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන විවිධ බලපෑම් ගවේෂණය කරයි. | • ජාත්‍යන්තර සම්බන්ධතාවල වර්තමාන ස්වරූපය<br>• ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම | • ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට බලපෑ හේතු නම් කරයි.<br>• ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය විස්තර කරයි.<br>• ජාත්‍යන්තර සබඳතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම් පැහැදිලි කරයි. | 02 |
| | 11.5.3 තෝරාගත් කලාපීය හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරීත්වය විමර්ශනය කරයි. | • කලාපීය සංවිධාන<br>• සාක්<br>• ආසියාන්<br>• කොළඹ ක්‍රමය<br>• බිම්ස්ටෙක් | • කලාපීය සංවිධාන පිළිබඳ පැහැදිලි කරයි.<br>• ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ විස්තර කරයි.<br>• තෝරාගත් සංවිධාන කිහිපයක සේවය අගය කරමින් අදහස් ඉදිරිපත් කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 11.5.4 සුවිශේෂ අරමුණු සඳහා ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමෙන්, ශ්‍රී ලංකාවට අත්වන යහපත් ප්‍රතිඵල විමසා බලයි. | • ජාත්‍යන්තර සංවිධාන<br>• එක්සත් ජාතීන් හා එයට අනුබද්ධිත ආයතන<br>• පොදු රාජ්‍ය මණ්ඩලය<br>• නොබැඳි සමුළුව<br><br>• ජාත්‍යන්තර සම්බන්ධතා මාධ්‍ය<br>* තානාපති සේවය<br>* වෙළෙඳාම<br>* යුද්ධය<br>* විදේශාධාර<br>* පරිත්‍යාග<br>* සාමය<br>* සංවර්ධනය<br>• ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල<br>• ජාත්‍යන්තර සුහදතාව වර්ධනය වීම<br>• නව රැකියා අවස්ථා උදා වීම<br>• හදිසි අවස්ථාවල දී අන්‍යෝන්‍ය ආධාර උපකාර කර ගැනීම<br>• තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම<br>• සංවර්ධනයට අවශ්‍ය සහාය ලැබීම | • ජාත්‍යන්තර සම්බන්ධතා මාධ්‍ය නම් කරයි.<br>• ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල විග්‍රහ කරයි. | 08 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 11.1 නීතිය හා යුක්තිය

ප්‍රජාතන්ත්‍රවාදී රටක පැවැත්ම උදෙසා නීති රීති මෙන් ම නීතියේ ආධිපත්‍යය අත්‍යවශ්‍ය ගුණාංගයකි. නීතිගරුක පුරවැසියෙකු ලෙස සමාජයේ ජීවත් වීමට පුද්ගලයා හුරු වීම අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා රටක පවතින නීති රීති පිළිබඳ ව මෙන් ම අධිකරණ ආයතන පිළිබඳ වත් ඒවායේ කාර්ය හා බලතල පිළිබඳ වත් දැන සිටීම අත්‍යවශ්‍ය වේ.

සමාජය තුළ සිදු වන බොහෝ ගැටුම්, ආරවුල් ආදිය ඇති වන්නේ පුද්ගලයන් නීති ගරුක නොවීම නිසා ය. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පැවැත්ම සහතික කිරීමට නම් නීතිගරුක පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අත්‍යවශ්‍ය වේ. නීතිගරුක පුරවැසියෙකු සමාජයට දායාද කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම මෙම පරිච්ඡේදය තුළින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව**

• නීතිගරුක පුරවැසියෙකු ලෙස ජීවත් වෙයි.

**නිපුණතා මට්ටම**

11.1.1 විවිධ නීති වර්ග හා ඒ එක එකකට අදාළ ව රාජ්‍යයේ භූමිකාව විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** :- 04යි

**ඉගෙනුම් පල**

- නිර්වචන ඇසුරින් නීතිය හඳුන්වයි.
- දේශීය නීතිය අර්ථ දක්වයි.
- අන්තර්ජාතික නීතිය විස්තර කරයි.
- විවිධ නීති වර්ගවලට අදාළ ව රාජ්‍යයේ භූමිකාව පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- **නීතිය නිර්වචනය කිරීම හා හැඳින්වීම**
  - නීතිය පිළිබඳ දාර්ශනිකයන් නීතිය විවිධ ආකාරයට නිර්වචනය කර ඇත. (පෙළ පොතෙහි සඳහන් නිර්වචන ඇසුරින් නීතිය යන්න හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න)
  - යුක්තිය පරමාදර්ශී සංකල්පයකි. නීතිය සාධාරණ ලෙස ඉටු වීම තුළින් ජනතාවට යුක්තිය ඉටු වේ.
  - නීතිය ක්‍රියාත්මක කිරීමේ දී සාධාරණ හා යුක්ති සහගත ලෙස එය ක්‍රියාවට නැංවීම තුළින් සමාජය නීතිගරුක වීමත් ජනතාව තුළ නීතිය කෙරෙහි විශ්වාසය තහවුරු වීමත් සිදු වන බව පැහැදිලි කරන්න.

- නීතියේ ගුණාංග (පෙළ පොතේ සඳහන් කරුණු ඇසුරින් නීතියේ ගුණාංග හඳුන්වන්න)
- නීතිය පිළිබඳ පවත්නා මූලාශ්‍රය

**මූලික මූලාශ්‍රය**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- ව්‍යවස්ථා (ආඥාපනත් හා පනත්)
- අධිකරණ තීරණ

**ද්විතීය මූලාශ්‍රය**

- සිරිත්විරිත්, සම්ප්‍රදායන්, ආගම, නීති විශාරදයන්ගේ මත ආදිය

**නීති වර්ග**

01. දේශීය නීතිය

02. අන්තර්ජාතික නීතිය

**1. දේශීය නීතිය**

දේශීය නීතිය යනු රටක ක්‍රියාත්මක වන නීති පද්ධතිය යි. රටක අවශ්‍යතා අනුව එම රටේ නීති පද්ධතිය සකස්වන අතර එය රටකින් රටකට වෙනස් වන බව පැහැදිලි කරන්න. ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය රෝම ලන්දේසි නීතිය, ඉංග්‍රීසි නීතිය, උඩරට නීතිය, මුස්ලිම් නීතිය වැනි දේශීය නීතිවලින් පෝෂණය වී ඇත.

ශ්‍රී ලංකාවේ දේශීය නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, අපරාධ නිතිය හා සිවිල් නීතිය ලෙස වර්ග කර දැක්විය හැකි ය. මෙම නීති වර්ග කෙටියෙන් හඳුන්වන්න. අපරාධ නීතිය කඩ කිරීම හා සම්බන්ධ දඬුවම් පිළිබඳ ව දැනුවත් කරන්න.

**2. අන්තර්ජාතික නීතිය**

මූලික අරමුණ :- රාජ්‍යයන් අතර සබඳතා විධිමත් ලෙස පාලනය කිරීම. වර්තමානයේ ජාත්‍යන්තර සංවිධාන, මානව හිමිකම් වැනි කරුණු ද අන්තර්ජාතික නීතියට සම්බන්ධ වී ඇත.

- විවිධ නීති වර්ගවලට අදාළ ව රාජ්‍යයේ භූමිකාව
  - රාජ්‍යයක වගකීම වන්නේ රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම යි. රට තුළ පැන නගින ගැටලු, අර්බුද සහ නීතිය කඩ කිරීම් ආදියට සම්බන්ධ සිද්ධි සඳහා දේශීය නීති රාමුව ඇසුරින් විසඳුම් ලබා දීම යි.
  - රාජ්‍යයන් වශයෙන් වෙනත් රටවල් සමග කටයුතු කිරීමේ දී ජාත්‍යන්තර නීතිවලට ද අනුව කටයුතු කළ යුතු ය. (උදාහරණ ලෙස නාවික ගමනාගමනය, ගුවන් ගමන්) එමෙන් ම එක්සත් ජාතින්ගේ සංවිධානය වැනි ආයතන සමග කටයුතු කිරීමේ දී එවැනී නීතිවලට අනුගත වීමට සිදු වේ. ලෝකයේ රටවල් ජාත්‍යන්තර ව කටයුතු කිරීමේ දී පොදුවේ පිළිගත් චාරිත්‍රානුකූල නීති, ගිවිසුම් ආදියට අනුගත ව කටයුතු කළ යුතු වේ.

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972, 1978

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නීතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කිරීම, නීතියේ ගුණාංග, නීතියේ මූලාශ්‍රය ආදිය පිළිබඳ තොරතුරු ගවේෂණය සඳහා පැවරුම් ක්‍රියාකාරකම්වලට සුදුසු ඇගයිම් ප්‍රභේදයක්, සුදුසු ඇගයීම් ප්‍රභේද භාවිත කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.1.2 ශ්‍රී ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතිය හා එහි වර්ධනය විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 04යි

**ඉගෙනුම් පල**

- වත්මන් අධිකරණ පද්ධතියෙහි ඓතිහාසික වර්ධනය පැහැදිලි කරයි.
- වත්මන් අධිකරණ පද්ධතියට අයත් අධිකරණ වර්ග නම් කරයි.
- වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යයන් විස්තර කරයි.
- වත්මන් අධිකරණ පද්ධතියට අයත් අධිකරණ වර්ග පිළිබඳ විස්තර ගොනු කරයි.
- වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යයන් පිළිබඳ තොරතුරු දැන ගැනීම යහජීවනයට හේතුවන බව පිළිගනිමින් අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- වත්මන් අධිකරණ පද්ධතිය හා එහි ඓතිහාසික වර්ධනය සිදු වූ ආකාරය
- අධිකරණ පද්ධතියේ ආරම්භය රාජාණ්ඩු පාලන සමය දක්වා දිව යන බව
- යටත් විජිත සමය තුළ සිදු කළ හඳුන්වා දීම ඇසුරෙන් ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ක්‍රමික ව විකාශනය වූ බව
- නිදහසින් පසු විවිධ අවස්ථාවල දී ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ සිදු වූ විකාශනය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවස්ථාව සලසා දෙන්න.
- වර්තමානයේ සිවිල් හා අපරාධ නඩු සම්බන්ධයෙන් වෙන් වූ අධිකරණ ද එම අධිකරණවලින් දෙනු ලබන තීන්දු සම්බන්ධ අභියාචනා විභාග කිරීමේ බලය සහිත ජ්‍යෙෂ්ඨ (ඉහළ) අධිකරණය පිහිටුවා තිබෙන බව පැහැදිලි කරන්න.

පහත දැක්වෙන වර්තමාන අධිකරණ පද්ධතිය හා ඒවා සතු අධිකරණ බලය පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

ශ්‍රේෂ්ඨාධිකරණය

අභියාචනාධිකරණය

පළාත්බද මහාධිකරණය

මහාධිකරණය

දිසා අධිකරණය

මහේස්ත්‍රාත් අධිකරණය

මෙම අධිකරණ පද්ධතියට අමතර ව අධිකරණ බලතල සහිත විනිශ්චය අධිකාර සහ ආයතන පවතින බව අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

නිදසුන් - කම්කරු විනිශ්චය සභාව

- කාති උසාවි

මෙයට අමතර ව අර්ධ අධිකරණ ආයතනයක් ලෙස සමථ මණ්ඩල ද ක්‍රියාත්මක වේ.

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978, පෙළ පොත, අධිකරණ වර්ග හා ඒවායේ බලතල දැක්වෙන ලිපි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

විෂය අන්තර්ගතය ආවරණය වන පරිදි පැවරුම් ඉදිරිපත් කිරීම් හෝ බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කිරීමට සිසුන් යොමු කරවා නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.1.3 නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන්ගේ කාර්යභාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :-** 02යි

**ඉගෙනුම් පල**

- අධිකරණ ඇමැතිවරයාගේ කාර්යභාරය සාකච්ඡා කරයි.
- අග්‍රවිනිශ්චයකාරවරයාගේ කාර්යභාරය විස්තර කරයි.
- නීතිපතිවරයාගේ කාර්යභාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- **අධිකරණ ඇමතිවරයාගේ කාර්යභාරය**
  - අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධානියා අධිකරණ ඇමතිවරයා වන බැවින් අමාත්‍යාංශය පිළිබඳ වගකීම ඔහු වෙත පැවරෙන බවත් අධිකරණ ක්ෂේත්‍රයට අදාළ නීති කෙටුම්පත් සකස්කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒවා සම්මත කර ගැනීමේ කාර්යභාරය මූලික වශයෙන් අධිකරණ ඇමතිවරයා වෙත පැවරෙන බවත් සිසුන්ට පැහැදිලි කරන්න.
  - අධිකරණ ඇමතිවරයා පත්වන ආකාරය සහ කාර්යභාරය පිළිබඳ පෙළපොත ඇසුරින් කරුණු අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
- **අග්‍රවිනිශ්චයකාරවරයා**
  - ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා ලෙසත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙසත් නීති අධ්‍යයන සභාවේ සභාපති ලෙසත් කටයුතු කරන බව
  - ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය විමර්ශනය කිරීමේ බලය අග්‍රවිනිශ්චයකාරවරයාට හිමිවන බවත් විස්තරාත්මක ව අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- **නීතිපති**
  - ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රධාන නීති නිලධාරියා ලෙසත් නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙසත්
  - රාජ්‍ය සම්බන්ධ සියලු නීති කාර්යයන් වෙනුවෙන් රජයේ නියෝජිතයා ලෙස පෙනී සිටින බවත් පැහැදිලි කිරීමට සුදුසු ඉගෙනුම් / ඉගැන්වීම් ක්‍රම භාවිත කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉගෙනුම් පල සාධනය පිළිබඳ මැන බැලීමට සුදුසු ඇගයීම් ක්‍රමවේද භාවිත කරන්න. නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.1.4 ආරවුල් විසඳීම සඳහා වන විකල්ප ක්‍රම පිරික්සයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :- 02යි

**ඉගෙනුම් පල**

- ආරවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම නම් කරයි.
- ආරවුල් සාමකාමී ව විසඳා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

අධිකරණයකට ඉදිරිපත් නොකොට ආරවුල් බේරුම්කර ගැනීමට යොදාගත හැකි ය.

විකල්ප ක්‍රම (මෙම ආයතන සම්බන්ධ පෙළ පොතෙහි සඳහන් කරුණු අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.)

- උපදේශනය
- සමථකරණය
- බේරුම්කරණය
- ඔම්බුඩ්ස්මන්
- මානව හිමිකම් කොමිසම

- ආරවුල් සාමකාමී ව විසඳා ගැනීමේ වැදගත්කම අවධාරණය කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978

**ඇගයීම් හා තක්සේරුකරණය**

සිද්ධි අධ්‍යයනය, භූමිකා රංගන, පැවරුම් වැනි සුදුසු ඇගයීම් ක්‍රමවේද භාවිත කරමින් නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.1.5 නීතියේ ආධිපත්‍යය සහ අප්‍රමාද ව හා අපක්ෂපාතී ව යුක්තිය පසිඳලීමේ වැදගත්කම අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :- 03යි

**ඉගෙනුම් පල**

- නීතියේ ආධිපත්‍ය යන්න අර්ථ දක්වයි.
- අධිකරණයේ ස්වාධීනත්වය යනු කුමක් දැ යි විස්තර කරයි.
- අධිකරණයේ ස්වාධීනත්වයේ ඇති වැදගත්කම අගය කරයි.
- අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර විස්තර කරයි.
- නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත් වීමේ වැදගත්කම අගය කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

නීතියේ අධිපත්‍ය හැඳින්වීම

නීතිය ඉදිරියේ සැවොම සමාන බවත්, නීතියේ රැකවරණය සර්ව සාධාරණ ව සියලු දෙනාට ම හිමි විය යුතු බවත් කිසිවෙකුට නීතියට ඉහළින් පැවතිය නොහැකි බවත් අවධාරණය වන පරිදි නීතියේ අධිපත්‍ය යන සංකල්පය හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

- අධිකරණයේ ස්වාධීනත්වය

යුක්තිය පසිඳලීම අධිකරණයෙන් ඉටු වන මූලික කාර්යය වන බවත් අධිකරණයට කිසිදු බාහිර බලපෑමකින් තොර ව කටයුතු කිරීමට අවශ්‍ය මූලික තත්ත්වයන් තහවුරු කර තිබීම අවශ්‍ය බවත් පැහැදිලි වන ලෙස සාකච්ඡාවක් මෙහෙය වන්න.

- අධිකරණයේ ස්වාධීනත්වය වැදගත්වන ආකාරය
  - බලපෑමකින් තොර ව අපක්ෂපාති නඩු තීන්දු ලබා දීමට
  - නීතියේ ආධිපත්‍ය සුරැකීමට
  - මූලික අයිතිවාසිකම් සුරැකීමට
  - අධිකරණය කෙරෙහි ජනතා විශ්වාසය සහ ගරුත්වය තහවුරු කිරීමට
  - යුක්තිගරුක ජන සමාජයක් බිහි කිරීමට

- අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති විධිවිධාන
  - අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

- අප්‍රමාද ව හා අපක්ෂපාතී ව යුක්තිය පසිඳලීමේ වැදගත්කම
  - නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම යුක්තිය ඉටු වීම ප්‍රමාද කිරීමට හේතු වන බව
  - නඩුතීන්දු අප්‍රමාද ව හා කාර්යක්ෂම ව ලබා දීමේ වැදගත්කම

- රට තුළ අපරාධ හා දූෂණ අඩු වීම
- නීතිය තම අතට නොගෙන නීති ප්‍රවාහය තුළින් යුක්තිය ඉටුකර ගැනීමට පෙලඹවීම ආදි කාර්යයන් මේ නිසා ඉටු වන බව පැහැදිලි කරන්න.

• නීතිගරුක පුරවැසියකු ලෙස ජීවත් වීමේ වැදගත්කම

- ජනසමාජය තුළ නීතිය හා සාමය සුරක්ෂිත වීම
- අයිතිවාසිකම් සුරැකීම
- තම ආත්ම ගරුත්වය හා ආත්මාභිමානය වර්ධනය වීම
- සාමකාමී සහජීවනයක් ඇති වීම
- අන්‍යයන්ගේ ගෞරවයට හා ඇගයීමට පාත්‍ර වීම

නීතිගරුක වීම තම දිවිපැවැත්මේ ප්‍රධාන අංග ලක්ෂණයක් විය යුතු බව අවධාරණය වන පරිදි මෙම කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978, නීතිගරුක පුරවැසියන් ලෙස කටයුතු කළ අවස්ථා ඇගයීමට ලක් වූ පුවත්පත් වාර්තා ආදිය.

**ඇගයීම හා තක්සේරුකරණය**

පැවරුම් , භූමිකා රංගන, ස්වනිර්මාණ සංග්‍රහය සැකසීම වැනි ඇගයීම් ප්‍රභේද භාවිත කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - නීතිගරුක පුරවැසියෙකු ලෙස ජීවත් වෙයි.

**නිපුණතා මට්ටම** - ශ්‍රී ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතිය හා එහි වර්ධනය විශ්ලේෂණය කරයි.

**ඉගෙනුම් පල** –
- වත්මන් අධිකරණ පද්ධතියට අයත් අධිකරණ වර්ග නම් කරයි.
- වත්මන් අධිකරණ වර්ගවල බලතල හා කාර්යයන් විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - "අධිකරණ වර්ග, ඒවායේ බලතල හඳුනා ගනිමු "

**කාලයඃ** - මිනිත්තු 40යි

**ගුණාත්මක යෙදවුම්** - ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය දැක්වෙන පින්තූරයක්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ඇමුණුම් 11.1.1 අදාළ කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**
- ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය දැක්වෙන පින්තූරයක් පන්තියේ සිසුන්ට ප්‍රදර්ශනය කර එය හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශ්‍රී ලංකාවේ අධිකරණ වර්ග පිළිබඳ සිසුන් දන්නා තොරතුරු ඇසුරින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

**පියවර II**
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ ව කාර්ය පත්‍රිකාව බැගින් ලබා දෙන්න.
- එම කාර්ය පත්‍රිකාව අනුව අදාළ ක්‍රියාකාරකමෙහි නිරත වීමට සිසුන්ට අවස්ථා ව ලබා දෙන්න.
- කණ්ඩායම් විසින් සකස් කර ගන්නා ලද තොරතුරු හා අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර III**
- සිසුන් විසින් කණ්ඩායම් අනාවරණ ලෙස ඉදිරිපත් කරන ලද තොරතුරු ද ඇසුරු කර ගනිමින් ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- පහත දැක්වෙන නිර්ණායක පදනම් කර ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- ශ්‍රී ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතියෙහි අධිකරණ ආයතන නම් කරයි.
- අධිකරණ ආයතන සඳහා විනිසුරුවන් පත් කරන ආකාරය හා ඉවත් කරන ආකාරය පිළිබඳ විග්‍රහ කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් අනාවරණය කර ගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කරයි.
- කාලය කළමනාකරණය කර ගනිමින් නියමිත කාලය තුළ කාර්යය නිම කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව සාමූහික ව කටයුතු කරයි.

ඇමුණුම් 11.1.1

කාර්ය පත්‍රිකා I

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් තොරතුරු රැස් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| විනිසුරුවන් පත් කරන ආකාරය | බලතල හා කාර්ය | විනිසුරුවන් ඉවත් කරන ආකාරය |
|---|---|---|
| | | |

කාර්ය පත්‍රිකා II

ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණය සම්බන්ධයෙන් තොරතුරු රැස් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| විනිසුරුවන් පත් කරන ආකාරය | බලතල හා කාර්ය | විනිසුරුවන් ඉවත් කරන ආකාරය |
|---|---|---|
| | | |

කාර්ය පත්‍රිකා III

ශ්‍රී ලංකාවේ පළාත්බඳ අධිකරණය සම්බන්ධයෙන් තොරතුරු රැස් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| විනිසුරුවන් පත් කරන ආකාරය | බලතල හා කාර්ය | විනිසුරුවන් ඉවත් කරන ආකාරය |
|---|---|---|
| | | |

කාර්ය පත්‍රිකා IV

ශ්‍රී ලංකාවේ මහාධිකරණය සම්බන්ධයෙන් තොරතුරු රැස් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| විනිසුරුවන් පත් කරන ආකාරය | බලතල හා කාර්ය | විනිසුරුවන් ඉවත් කරන ආකාරය |
|---|---|---|
| | | |

කාර්ය පත්‍රිකා V

ශ්‍රී ලංකාවේ දිසා අධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය සම්බන්ධයෙන් තොරතුරු රැස් කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| විනිසුරුවන් පත් කරන ආකාරය | බලතල හා කාර්ය | විනිසුරුවන් ඉවත් කරන ආකාරය |
|---|---|---|
| | | |

## 11.2 ආණ්ඩුවේ විවිධ ස්තර

පුරවැසි අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුවක ප්‍රධානතම වගකීම වේ. මෙම වගකීම කොතෙක් දුරට ඉටු වන්නේ ද යන්න පිළිබඳ ව විමසා බැලීමේ දී ආණ්ඩුවේ විවිධ ස්තර හා ඒවායේ කාර්ය භාරය පිළිබඳ ව සොයා බැලීම වැදගත් වේ. නූතන සමාජයේ මිනිස් අවශ්‍යතා සංකීර්ණ වී ඇති අතර ආණ්ඩුවේ කාර්යයන් ද එයට සාපේක්ෂ ව සංකීර්ණ වී ඇත. මෙම සංකීර්ණ කාර්යභාරය ආණ්ඩුවේ විවිධ ස්තර මගින් ක්‍රියාවට නංවනු ලබයි.

මෙම ඒකකයෙන් අපේක්ෂා කරන්නේ ඉහත විවිධ සංකීර්ණ අවශ්‍යතාවලට සාපේක්ෂ ව පිහිටුවා ඇති මධ්‍යම ආණ්ඩුවේ හා අනෙකුත් ස්තරවල කාර්යභාරය, ඒවායේ ඵලදායිතාව ක්‍රියාත්මක කිරීමේ දී මතු වන ගැටලු පිළිබඳ සොයා බැලීම ය. මෙයට අමතර ව ආණ්ඩුවේ ස්තරවල කාර්යයන් පුරවැසියන් වෙනුවෙන් ඉටු කිරීමේ දී ආයතනවල වගකීම හා වගවීම පිළිබඳ වත් ප්‍රතිලාභ ලබන පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් පිළිබඳ වත් මෙ මගින් විමර්ශනය කෙරේ. ආණ්ඩුවේ විවිධ ස්තරවල ස්වාභාවය, කාර්යභාරය ඒවායේ ඵලදායි බව හා පුරවැසි කාර්යභාරය සම්බන්ධයෙන් අවශ්‍ය නිපුණතා සිසුන් තුළ වර්ධනය කිරීම ද මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව**

- ආණ්ඩුවේ විවිධ ස්තරවල භූමිකා පිළිබඳ ව විමර්ශනය කරමින් වගකීමෙන් යුතු පුරවැසියකු ලෙස ජීවත්වීමට පෙලෙඹෙයි.

**නිපුණතා මට්ටම**

11.2.1 මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල විකාශනය විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 04යි

**ඉගෙනුම් පල**

- මධ්‍යම ආණ්ඩුවේ ඓතිහාසික විකාශනය විස්තර කරයි.
- මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කිරීමට හේතු විස්තර කරයි.
- ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- මධ්‍යම ආණ්ඩුව පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පෙර පැවති තත්ත්වය හා වර්තමාන ව්‍යුහ හඳුන්වා දීම
- ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමෙන් පසු පාලන කටයුතුවල ඇති වූ වැදගත් වෙනස්කම්
  - 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් ව්‍යවස්ථාදායක සභාව ඇති කිරීම හා විධායක කාරක සභා ඇති කිරීම
  - බ්‍රිතාන්‍යයන් විසින් 1910, 1921, 1924 දී ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් අභ්‍යන්තර ස්වාධීන පාලනයක් ලබා නොදීම
  - 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ලාංකිකයන්ට දේශපාලන මැදිහත් වීමට වැඩි අවස්ථාව ලබා දීම

    උදාහරණ - සර්ව ජන ඡන්ද බලය / රාජ්‍ය මන්ත්‍රණ සභාව / විධායක කාරක සභා
- 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් ලංකාවට ඩොමිනියන් තත්ත්වයක් ප්‍රදානය කිරීම.
  - 1948 පෙබරවාරි 04 වන දින නිදහස ලැබීම
  - කැබිනට් ආණ්ඩුක්‍රමය
  - ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුව
  - බ්‍රිතාන්‍ය රජු රාජ්‍ය නායකයා ලෙස පිළිගෙන කිරීටයේ නාමයෙන් සියලු කටයුතු පවත්වා ගෙන යාම
  - බ්‍රිතානය කිරීටය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර ධුරයක් ඇති කිරීම
  - අවසාන අභියාචනාධිකරණය ලෙස බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලය (රාජාධිකරණය) පිළිගැනීම
  - ස්වාධින රාජ්‍ය සේවා හා අධිකරණ සේවා කොමිෂන් සභා පිහිටුවීම
  - සුළු ජාතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ පාලන තන්ත්‍රයේ සිදු කළ ඉහත දක්වා ඇති වෙනස් කම් පිළිබඳ විමර්ශනය කිරීමට සිසුන් යොමු කරන්න.

- 1972 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කිරීම.
    - ඩොමීනියන් තත්ත්වය අහෝසිකර ස්වාධීන ජනරජයක් බවට පත් වීම
    - ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම
    - අග්‍රාණ්ඩුකාර ධූරය අහෝසි කරමින් ජනාධිපති ධූරයක් ඇති කිරීම
    - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල පනත් කෙටුම්පත් පිළිබඳ සොයා බැලීමට ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම උසාවිය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගැනීම
    - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටු වීම
    - සොල්බරි ව්‍යවස්ථාව යටතේ පැවති ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම අහෝසි කරමින් රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයක් හා රාජ්‍ය සේවා විනය මණ්ඩලයක් ද අධිකරණ සේවා උපදේශක මණ්ඩලයක් හා අධිකරණ සේවා විනය මණ්ඩලය පිහිටුවීම
    - ප්‍රථමවරට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
    - රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම ව්‍යවස්ථාගත කිරීම.

- 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාව නිර්මාණය කිරීම
    - විධායක බලය සහිත ජනාධිපති ධූරයක් ඇති කිරීම
    - විධායක ජනාධිපති ප්‍රමුඛ ව අගමැති හා අමාත්‍ය මණ්ඩලය හඳුන්වා දීම
    - සරල බහුතර නියෝජන ක්‍රමය අහෝසිකර සමානුපාතික නියෝජන ක්‍රමය ඇති කිරීම
    - මන්ත්‍රීවරු 225කින් යුත් පාර්ලිමේන්තුව හඳුන්වා දීම
    - ශ්‍රේෂ්ඨාධිකරණයට අමතර ව අභියාචනාධිකරණය හා මහාධිකරණය පිළිබඳ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
    - රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම නැවත ඇති කිරීම
    - මූලික අයිතිවාසිකම් විස්තරාත්මක ව දක්වා ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
    - මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය ඇති කිරීම

- **ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු**
    - බලය විමධ්‍යගත කිරීම සඳහා වර්තමානයේ පිහිටුවා ඇති ඒකක
    - පළාත් සභා
    - පළාත් පාලන ආයතන
    - බලය විමධ්‍යගත කිරීමට හේතු

    උදාහරණ කිහිපයක් පහත දැක්වේ.
    - ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් කිරීම
    - පාලන කටයුතු සඳහා පුළුල් සහභාගීත්වයක් ඇති කිරීම

- ජනතාවගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටුකර දීම
- ජනතාවට වඩාත් සමීප වූ පරිපාලන ඒකක පිහිටු වීම
- ප්‍රාදේශීය තරුණ නායකත්වයට වැඩි අවස්ථා ලබා දීම
- මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ලිහිල් කිරීම

- ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමේ දී මතුවන ගැටලු
  - එක් එක් ප්‍රාදේශීය ඒකක සතු ව පවතින සම්පත්වල විෂමතා අනුව වාසි හා අවාසි සිදු වීම
  - ජනතා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා යොමු විය යුතු ප්‍රාදේශීය ඒකක පිළිබඳ ජනතාවට ගැටලුකාරී තත්ත්වයක් ඇති වීම

  උදාහරණ-

  මාර්ගයක් අලුත්වැඩියා කර ගැනීම සඳහා ඉල්ලුම් කළ යුත්තේ මධ්‍යම ආණ්ඩුවට ද පළාත් සභාවට ද නැත්නම් පළාත් පාලන ආයතනයට ද යන්න පැහැදිලි නොවීම
  - පළාත් සභා බල ප්‍රදේශයක් වුවත් විශාල භූමි ප්‍රමාණයක විසිරි ඇති විට ජනතාවට සමීප ආයතනයක් බවට පත් නොවීම
  - බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර ගැටලු ඇති වීම

**ගුණාත්මක යෙදවුම්**

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හා ඉන් පසු ව සිදු කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ව්‍යවස්ථාදායකයේ සිදු කළ වෙනස්කම් දැක්වෙන දළ සැලැස්මක්, 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙන ලද මූලිකාංග පිළිබඳ සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සුදුසු ඇගයීමක් පිළියෙල කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.2.2 මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාවල හා පාළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයන් පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 07යි


**ඉගෙනුම් පල**

- මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ව්‍යුහය, බලතල හා කාර්ය භාරය සාකච්ඡා කරයි.
- ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ක්ෂේත්‍රයන් හි බලතල හා කාර්යයන් පිළිබඳ දැනුවත් වීම පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයට වැදගත් වන බව පිළිගනිමින් අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

**මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහය, බලතල හා කාර්යයන්**

- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහය




**විධායකය**

**විධායක ජනාධිපති**

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(1) ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපති තනතුර පිළිබඳ මෙසේ දැක්වේ.

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයෙක් වන්නේ ය. ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානයා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා ද වන්නේ ය.

* ජනාධිපතිවරයා සතු කාර්යභාරය සහ බලතල පිළිබඳ පෙළ පොත හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇසුරින් අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

**ව්‍යවස්ථාදායකය**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ x වන පරිච්ඡේදයේ 62 (1) හා 62 (2) ව්‍යවස්ථා මගින් පාර්ලිමේන්තුවේ සංයුතිය හා නිල කාලය දක්වා ඇත.

- ව්‍යවස්ථාදායකය සතු බලතල

උදාහරණ - නීති සම්පාදනය
- අයවැය සම්මත කිරීම
- දෝෂාභියෝග හා විශ්වාසභංග යෝජනා ගෙන එමින් විධායකය පාලනය කිරීම
- විධායකය පවත්වා ගෙන යාමට අවශ්‍ය බහුතරය සැපයීම
- මහජන දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම හා සාකච්ඡා කිරීම
- රාජ්‍ය ආයතනවල කටයුතු විමර්ශනය කිරීම

**අධිකරණය**

- ශ්‍රී ලංකා අධිකරණ පද්ධතිය එහි බලතල හා කාර්යයන් මෙම ගුරු මාර්ගෝපදේශයේ පළමුවන පරිච්ඡේදයේ නීතිය හා යුක්තිය පරිච්ඡේදයෙහි විස්තර කර ඇත.

**පළාත් සභා ව්‍යුහය, බලතල හා කාර්යයන්**

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් ශ්‍රී ලංකාවේ සෑම පළාතක් සඳහා ම පළාත් සභා පිහිටු වීමට විධිවිධාන සලසා ඇත.
- සෑම පළාත් සභාවක් ම මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රී මණ්ඩලයකින් හා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ආණ්ඩුකාරවරයකුගෙන් සමන්විත වේ.
- පළාත් සභාව තුළ බහුතර ආසන සංඛ්‍යාවක් හිමිකර ගන්නා කණ්ඩායමෙන් ප්‍රධාන අමාත්‍යවරයෙක් හා සිව් දෙනකුට නොවැඩි අමාත්‍ය මණ්ඩලයක් පත් කර ගැනේ.
- 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන උපලේඛනයේ පළාත් සභා සතු බලතල ලැයිස්තු 03ක් යටතේ දක්වා ඇත.

| | |
|---|---|
| I වන ලැයිස්තුව | - පළාත් සභා ලැයිස්තුව |
| II වන ලැයිස්තුව | - සංවෘත ලැයිස්තුව (මධ්‍යම ආණ්ඩුව සතු බලතල) |
| III වන ලැයිස්තුව | - සමගාමී ලැයිස්තුව (මධ්‍යම ආණ්ඩුවට හා පළාත් සභාවලට සමසේ භුක්ති විඳිය හැකි බලතල) |

පළාත් සභා බලතල හා කාර්යයන් Iවන ලැයිස්තුව මගින් දක්වා ඇත.

I ප්‍රඥප්ති සෑදීම

පළාත් සභා විසින් තමන්ට පැවරී ඇති බලතල අනුව එම පළාත් සභාවට පමණක් අදාළ වන පරිදි පනවනු ලබන නිතිරීති ප්‍රඥප්ති වේ.

ප්‍රඥප්ති පැනවිය හැකි විෂය බලතල 37 ක් 9 වන උපලේඛනයේ දක්වා ඇත.

උදාහරණ-

- ආර්ථික සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
- පළාත් පාලන කටයුතු
- සෞඛ්‍ය (ශික්ෂණ හා විශේෂ කාර්යය සඳහා වූ රෝහල් හැර)
- මහාමාර්ග (ජාතික මහා මාර්ග හැර පළාත් ඇතුළත පාරවල්)
- කෘෂිකර්මය හා ගොවිජන සේවා

II අධිකරණ කටයුතු

- පළාත්බද මහාධිකරණයක් හඳුන්වා දීම
- පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති බලතල සම්බන්ධයෙන් රිට් ආඥා නිකුත් කිරීම (මේ සම්බන්ධ ව නීතිය හා යුක්තිය පරිච්ඡේදය බලන්න.)

III රාජ්‍ය සේවය

13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ රාජ්‍ය සේවය කොටස් දෙකකින් යුක්ත වේ.

- මධ්‍යම ආණ්ඩුවේ රාජ්‍ය සේවය
- පළාත් රාජ්‍ය සේවය

පළාත් රාජ්‍ය සේවයේ කටයුතු පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව මගින් ක්‍රියාත්මක වේ.

උදාහරණ- පළාත් රාජ්‍ය සේවය යටතේ වන නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම උසස් කිරීම, සේවයෙන් පහ කිරීම හා විනය පාලනය

**පළාත් පාලන ආයතනවල ව්‍යුහය , බලතල හා කාර්යයන්**

- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වර්ග 03කි.
  - මහ නගර සභා
  - නගර සභා
  - ප්‍රාදේශීය සභා
- මහනගර සභාවක ප්‍රධානියා නගරාධිපති වන අතර නගර සභාවක හා ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා සභාපති ලෙස හැඳින්වේ.
- මෙම ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත්කර ගනු ලබන්නේ මහජන ඡන්දයෙනි.

මෙම ත්‍රිවිධ ආයතනයන්ට පැවරී ඇති කාර්යයන් පහත දැක්වේ.

පොදු මංමාවත්
- මංමාවත් ආරක්ෂා කිරීම
- නඩත්තු කිරීම
- ඉදි කිරීම
- ස්ථාන මැන බේරුම් කිරීම හා අවහිරතා ඉවත් කිරීම
- ජල මාර්ග හා ශුද්ධ පවිත්‍ර කටයුතු සඳහා නළ යෙදීම
- අතුරු පාරවල් (තාවකාලික) ඉදි කිරීම

මහජන සෞඛ්‍ය
- පොදු කාණු ඉදිකිරීම, අලුත් වැඩියා කිරීම,
- මහජන වැසිකිළි ඉදි කිරීම හා නඩත්තු කිරීම
- මළාපවහන පද්ධතිය ක්‍රමවත් ව පවත්වාගෙන යාම
- අහිතකර ගොඩනැගිලි ඉවත් කිරීම, පීඩාවන් පරීක්ෂා කිරීම
- ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම

- පොදු ස්ථාන සඳහා විදුලි අලෝකය ලබා දීම
- මහජන වෙළෙඳ පොළ පවත්වා ගැනීම
- උයන්වතු, ක්‍රීඩා පිට්ටනි පවත්වා ගෙන යාම
- ජල සම්පාදනය
- පොදු නාන ස්ථාන පවත්වා ගෙන යාම
- පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යාම

පොදු උපයෝගීතා සේවා

පළාත් පාලන ආයතනවලින් සිදු වන සේවය පිළිබඳ ශිෂ්‍යශිෂ්‍යාවන් තුළ යහපත් ආකල්ප සංවර්ධනය වන අයුරින් මෙයට අදාළ විෂය කරුණු අධ්‍යයනයට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978. 1987 අංක 42 දරණ පළාත් සභා පනත

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉගෙනුම් පල සාධනය වුවා දැයි මැන බැලීමට සුදුසු පැවරුම් ඉදිරිපත් කිරීම, බුද්ධි මණ්ඩල සාකච්ඡා, විවාද වැනි ඇගයීම් ප්‍රභේද භාවිත කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.2.3 වත්මන් ව්‍යුහයන්හි සංවර්ධනාත්මක වෙනස්කම් අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :- 04යි

**ඉගෙනුම් පල**

- පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ඵලදායි බව පිළිබඳ සාකච්ඡා කරයි.
- පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා පුරවැසියාගේ වගකීම් හා යුතුකම් ලැයිස්තු ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ඵලදායි බව

- මහජන උපයෝගිතා සේවාවන් පහසුවෙන් ජනතාවට ලබා ගත හැකි වීම
- ප්‍රාදේශීය නායකයන් බිහි වීම
- සංවර්ධනාත්මක කටයුතු වේගවත් වීම

උදාහරණ- මංමාවත්, ජලය, විදුලිය වැනි යටිතල පහසුකම්

- සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු වර්ධනය වීම

උදාහරණ - රෝග මර්දන ව්‍යාපාර

- ළදරු පාසල් හා මාතෘ සායන මගින් ළමයින්ගේ හා මව්වරුන්ගේ අධ්‍යාපනික හා සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීම
- ප්‍රාදේශීය ජනතාවගේ විවේකය, විනෝදය, දැනුම ඵලදායි ලෙස වර්ධනය කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම

උදාහරණ- පුස්තකාල, කියවීම් ශාලා, පොදු උද්‍යාන, ව්‍යායාම මං තීරු

පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා වගවීම්

1. ජාතික හා ප්‍රාදේශීය ආරක්ෂාව සහතික කිරීම
2. ජාතික හා ප්‍රාදේශීය ආර්ථිකය සංවර්ධනය කිරීම
3. ජාතික හා ප්‍රාදේශීය සුභසාධන කටයුතු ඉහළ නැංවීම
4. ජාතික අභිමානය ඉහළ නැංවීම
5. නීතිය හා සාමය ආරක්ෂා කිරීම
6. ගැටුම් නිරාකරණය
7. ආපදා සඳහා සහන සේවා පවත්වා ගෙන යාම
8. පරිසර කළමනාකරණය හා පරිසර සංරක්ෂණය සිදු කිරීම
9. ජාතික හා ප්‍රාදේශීය වශයෙන් අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය
10. සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම
11. ජාතික ඒකාබද්ධතාව වර්ධනය
12. සමාජ සංහිඳියාව ඇති කිරීම
13. මහජන උපයෝගිතා සේවා නිසි කලට ඉටු කිරීම

14. ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
15. මහජන අවශ්‍යතාවලට අනුව නීතිරීති, ප්‍රඥප්ති සකස් කිරීම
16. පොදු දේපළ ආරක්ෂා කිරීමට විධිවිධාන සැලසීම
17. මානව සම්පත් සංවර්ධනය හා ජාතිහිතෛෂී නායකයන් බිහි කිරීම

ආණ්ඩුවේ විවිධ ස්තර කෙරෙහි පුරවැසියාගෙන් ඉටු විය යුතු වගකීම් සහ යුතුකම්

01. ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යාමට සහාය වීම
02. ආර්ථිකය සංවර්ධනය කිරීමට දායක වීම හා නිසි කලට නිසි පරිදි බදු මුදල් ගෙවීම
03. සුභසාධන කටයුතුවලින් නිසි ලෙස ප්‍රයෝජන ගැනීම
04. ජාතික අභිමානය ආරක්ෂිත කර ගැනීමට කැපවීම
05. නීතිය හා සාමය සුරක්ෂිත කිරීමට සහාය වීම
06. ගැටුම් අවම වන ලෙස හැසිරීම
07. ආපදා සඳහා සහන සේවා සැපයීමට ක්‍රියාකාරී ව සහභාගි වීම
08. ආපදා අවස්ථාවල දී ජනතාව සහ අදාළ ආයතන දැනුවත් කිරීම
09. පරිසරය ආරක්ෂා කිරීමට සහාය වීම
10. අධ්‍යාපන කටයුතුවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම
11. සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමට දායක වීම
12. විවිධ ජනවර්ග හා ආගමික කණ්ඩායම් අතර සුහදතාව වර්ධනයට දායක වීම
13. මහජන උපයෝගිතා සේවාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම හා ඒවා ආරක්ෂා කිරීම
14. සිදු විය යුතු ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක විය යුතු ස්ථාන පෙන්වා දීම සහ දායකත්වය සැපයීම
15. ආරක්ෂක කටයුතු සම්බන්ධ ව ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට සහාය වීම
16. පොදු දේපළ ආරක්ෂා කිරීමට දායක වීම

**ගුණාත්මක යෙදවුම්**

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, පළාත් දැක්වෙන ශ්‍රී ලංකා සිතියම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා යුතුකම් වෙනුවෙන් පුරවැසියාගෙන් ඉටු විය යුතු යුතුකම් ආවරණය වන පරිදි සුදුසු ඇගයීමක් සකස් කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - ආණ්ඩුවේ විවිධ ස්තරවල භූමිකා පිළිබඳ ව විමර්ශනය කරමින් වගකීමෙන් යුතු පුරවැසියකු ලෙස ජීවත් වීමට පෙලඹෙයි.

**නිපුණතා මට්ටම** - වත්මන් ව්‍යුහයන්හි සංවර්ධනාත්මක වෙනස්කම් අගය කරයි.

**ඉගෙනුම් පල** –පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා පුරවැසියාගේ වගකීම් හා යුතුකම් ලැයිස්තු ගත කරයි.

**ක්‍රියාකාරකම** - "යුතුකම් හා වගකීම් නොපිහිරිහෙලා ඉටු කරමු "

**කාලයඃ** - මිනිත්තු 40යි

**ගුණාත්මක යෙදවුම්** - මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභාවක ඡායාරූපයක්/පින්තූර, පළාත් පාලන ආයතන විසින් ඉටු කරන ලද කාර්යයන් දැක්වෙන පුවත්පත් වාර්තාවක්.
ඇමුණුම් අංක 01ට අදාළ කාර්ය පත්‍රිකාව

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර I**

- පළාත් පාලන ආයතනයක, නගර සභාවක, ප්‍රාදේශීය සභාවක ඡායාරූපයක්/පින්තූර, දැන්වීමක්, ඡායාරූපයක් ආදිය පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- පළාත් පාලන ආයතනවලින් ඉටුවන සේවා පිළිබඳ සිසුන් සමඟ කෙටි සාකච්ඡාවක් සිදු කරන්න.

**පියවර II**

- ඇමුණුම් අංක 01 හි සඳහන් කාර්යය පත්‍රිකාව පිළිබඳ පන්තියේ සිසුන් දැනුම්වත් කරන්න.
- කේවල ක්‍රියාකාරකමක් ලෙස එය ඉටු කිරීමට සිසුන්ට උපදෙස් දී අදාළ කාර්යයෙහි නිරත කරවන්න.
- අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබා දෙන්න.

**පියවර III**

- සිසුන් අනාවරණය කර ගත් තොරතුරු අහඹු ලෙස තෝරා ගත් සිසුන් කිහිපදෙනෙකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.
- අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම සහිත ව ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- අදාළ ඇගයීම් නිර්ණායක යොදා ගනිමින් සිසුන් තක්සේරුකරණයට ලක් කර ලකුණු පවරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන ආයතනවලින් පුරවැසියා කෙරෙහි ඉටු විය යුතු යුතුකම් විස්තර කරයි.
- මෙම ආයතන වෙත පුරවැසියාගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.
- පුරවැසියා හා ආණ්ඩුවේ විවිධ ස්තර අතර අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳ ව තම අදහස් ප්‍රකාශ කරයි.
- නිසි පරිදි කාලය කළමණාකරණය කර ගනිමින් තම කාර්යය මැනවින් ඉටු කරයි.
- ගුරු උපදෙස් මැනවින් පිළිපදියි.

**ඇමුණුම් අංක 01 කාර්යය පත්‍රිකාව**

ඔබ වෙත පැවරෙන්නේ පහත දී ඇති ආණ්ඩුවේ විවිධ ස්තර වෙතින් පුරවැසියන් කෙරෙහි ඉටු විය යුතු යුතුකම් ලැයිස්තු ගත කිරීමයි.

| පළාත් පාලන ආයතනය | පුරවැසියන් විසින් ඉටුකළ යුතු යුතුකම් |
|---|---|
| මහ නගර සභා | |
| නගර සභා | |
| ප්‍රාදේශීය සභා | |

## 11.3 මානව හිමිකම්

ඈත අතීතයේ දී මානව අයිතිවාසිකම් කෙරෙහි එතරම් අවධානයක් යොමු නොවුණි. විශේෂයෙන් ම තම මූලික අවශ්‍යතා සපුරා ගැනීම කෙරෙහි මිස තමන්ගේ ගරුත්වය හා වටිනාකම් කෙරෙහි එහි දී වැඩි සැලකිල්ලක් දක්වනු නොලැබී ය.

ලෝකයේ විවිධ පාලන යුගවල දී විවිධකාරයෙන් මානව නිදහස හා මානව හිමිකම් සීමා වී පැවති අතර පළමු හා දෙවන ලෝක යුද්ධ සමයන් තුළ එය වඩාත් හොඳින් කැපී පෙනුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙවන ලෝක යුද්ධයෙන් අනතුරු ව නැවත එවැනි ව්‍යසනකාරී තත්ත්වයක් කරා ලොව ගමන් කිරීම වළක්වාලීම සඳහා මෙන් ම ලෝක සාමය ස්ථාපිත කිරීමටත් මානව හිමිකම් හා මානව ගරුත්වය ඇති කිරීමත් පෙරදැරි කර ගෙන මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එළිදැක්වීම වැදගත් සන්ධිස්ථානයක් විය. මානව හිමිකම්වල විකාශනය මෙන් ම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ ව්‍යවස්ථා ප්‍රතිපාදන පිළිබඳ සිසුන් තුළ පවත්නා දැනුම ඉහළ නැංවීමත්, ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියෙකු වශයෙන් තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳ නිපුණතා සංවර්ධනය කිරීමත් මෙම පාඩම් ඒකකය තුළින් අපේක්ෂා කෙරේ.

• **නිපුණතාව**

මානව හිතවාදි පුරවැසියකු ලෙස කටයුතු කරයි.

11.3.1 **නිපුණතා මට්ටම**

මානව හිමිකම් සංකල්පය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 02යි

**ඉගෙනුම් පල**

- මානව හිමිකම් සංකල්පය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- මූලික අයිතිවාසිකම් විග්‍රහ කරයි.
- මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස හඳුනා ගෙන ඒ පිළිබඳ විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

මානව හිමිකම් සංකල්පය හැඳින්වීම

- මානව හිමිකම් විශ්ව සාධාරණ සංකල්පයක් බවත්
- සෑම මනුෂ්‍යකුට ම මිනිසකු ලෙස උපත ලැබීම නිසාවෙන් ම හිමිවන අයිතිවාසිකම් සමුදාය මානව හිමිකම් ලෙස හඳුන්වන බවත්
- මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම මගින් පුද්ගල නිදහස හා මානව ගරුත්වය තහවුරු වන බවත් අවධාරණය කරන්න.
- පෙළ පොතෙහි සඳහන් මානව හිමිකම් පිළිබඳ නිර්වචන ඇසුරින් මෙම සංකල්පය හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස හැඳින්වීම

- මානව හිමිකම් පුළුල් සංකල්පයක් බවත්
- රටක අවශ්‍යතාවලට හා සම්පත්වලට ගැළපෙන ලෙස මානව අයිතිවාසිකම් ඇසුරෙන් තෝරාගත් ප්‍රධානතම අයිතීන් රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැනි මූලික නීතිවලට ඇතුළත් කර තිබේ නම් ඒවා මූලික අයිතිවාසිකම් ලෙස හැඳින්වෙන බවත්
- අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා පවතින බවත්
- එම මූලික අයිතිවාසිකම් කඩ වූ විට නීතිය මගින් ප්‍රතිකර්ම ලබා ගත හැකි බවත් අධ්‍යයනය කිරීමට යොමු කරන්න.

උදාහරණ:- ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය

මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියා මාර්ග, 126 වන ව්‍යවස්ථාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978

**ගුණාත්මක යෙදවුම්**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය හා 126 වන ව්‍යවස්ථාව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සිසුන්ට මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් වෙන් කර හඳුනා ගැනීමට සුදුසු ක්‍රියාකාරමක් සකස් කර ඒ ඔස්සේ සිසුන් දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගෙන නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

11.3.2 **නිපුණතා මට්ටම**

අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 04 යි

**ඉගෙනුම් පල**

- මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධ වැදගත් වන ඓතිහාසික ප්‍රයත්න පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- මානව අයිතිවාසිකම් පිළිබඳ පුළුල් වශයෙන් අවධානය යොමු වූ හේතු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා විවිධ රටවල් ගත් ප්‍රයත්න හා ඉන් අනතුරු ව සම්මත කර ගනු ලැබූ විවිධ නීතිමය ලේඛන
  - ක්‍රි.ව. 1215 - මැග්නා කාර්ටා පනත
  - ක්‍රි.ව. 1679 - හබයාස් කෝප්පුස් ආඥාව
  - ක්‍රි.ව. 1689 - අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය
  - ක්‍රි.ව.1776 - ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය
  - ක්‍රි.ව. 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
  - ක්‍රි.ව. 1917 - රුසියන් විප්ලවය
  - ක්‍රි.ව. 1949 - චීන විප්ලවය
- මානව අයිතිවාසිකම් පිළිබඳ පුළුල් වශයෙන් සාකච්ඡා කිරීමට බලපෑ හේතු
  - I සහ II වන ලෝක යුද්ධවල දී මහා පරිමාණ ලෙස මිනිස් අයිතිවාසිකම් කඩවීම
  - එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි වීම හා එමගින් මානව හිමිකම් ආරක්ෂා කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග
  - විවිධ රටවල දේශීය නීතියට තෝරා ගත් මානව හිමිකම් ඇතුළත් කිරීම
  - මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා විවිධ සංවිධාන බිහි වීම

**ගුණාත්මක යෙදවුම්**

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

"මානව හිමිකම් දිනා ගැනීම සඳහා මිනිසා විසින් ගනු ලැබූ විවිධ උත්සාහයන්" මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීමට සලස්වා එය නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

11.3.3 **නිපුණතා මට්ටම**

එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කළ මානව හිමිකම් පිළිබඳ ලියවිලි විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 06යි

.

**ඉගෙනුම් පල**

- මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන් විසින් සම්මත කරගත් ප්‍රකාශන පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- CEDAW සම්මුතියේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.
- එක්සත් ජාතීන් විසින් ළමා අයිතිවාසිකම් සුරැකීමට ගෙන ඇති පියවර විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කළ මානව අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික ලියවිලි

1 එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

2 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)

3 ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)

4 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට අදාළ පළමුවන වෛකල්පික ගිවිසුම (1966)

5 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට අදාළ දෙවන වෛකල්පික ගිවිසුම (1989)

මෙයට අමතර ව කාන්තාවන්ගේ හා ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු කරගෙන සම්මුති 2ක් ඇති කර තිබේ.

1 කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW)

2 ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (CRC)

සමාජයේ ජීවත්වන පීඩාවන්ට හා බලපෑම්වලට පහසුවෙන් ගොදුරු වන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අන්තර් ජාතික ලේඛන සකස් වී තිබේ.

උදාහරණ:- ආබාධිත තැනැත්තන් ආරක්ෂා කිරීමට විශේෂ අවශ්‍යතා ඇති අයගේ අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම්

**ගුණාත්මක යෙදවුම්**

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW), ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (CRC)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉගෙනුම් පල සාධනය වු වා දැයි මැන බැලීම සඳහා නිර්ණායක මුලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න. (පැවරුම්, බිත්ති පුවත්පතකට සපයන ලිපි, පෝස්ටර් ප්‍රදර්ශන පුවරු නිර්මාණය වැනි ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කර ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.)

11.3.4 **නිපුණතා මට්ටම**

මානව අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් පුරවැසි කාර්යභාරය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 03යි

**ඉගෙනුම් පල**

- මානව අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.
- ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා පුරවැසියකු වශයෙන් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පුරවැසි යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.
- පාරිසරික පැවැත්ම තහවුරු කිරීම සඳහා පුරවැසියකු විසින් ඉටු කළ යුතු යුතුකම් පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී නීතිමය සීමා හඳුනා ගැනීම හා ඒවාට යටත් ව අයිතිවාසිකම් භුක්ති විඳීමට පුරවැසියන් බැඳී සිටින බව
- අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම
- මානව අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම්, විශේෂ අවශ්‍යතා ඇති අයගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පුරවැසි යුතුකම් ඉටු කිරීමට සෑම පුරවැසියෙකු ම බැඳී සිටින බව
- පිරිසිදු පානීය ජලය ලබා ගැනීම, දූෂණය නොවූ පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය ආදිය පාරිසරික අයිතිවාසිකම්වලට නිදසුන් වේ.
- පාරිසරික පැවැත්ම තහවුරු කිරීම සම්බන්ධයෙන් පුරවැසියන් ලෙස තම අයිතිවාසිකම් සහ යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම

උදාහරණ - ජල මූලාශ්‍රය ආරක්ෂා කිරීම, වනාන්තර ආරක්ෂා කිරීම, අපද්‍රව්‍ය ක්‍රමවත් ව බැහැර කිරීම

- යුතුකම් ඉටු කිරීම සැමගේ අයිතිවාසිකම් තහවුරු වීමට මූලික වශයෙන් හේතු වන බවත් සිසුන්ගේ අවධානයට යොමු වන ලෙස කරුණු අධ්‍යයනය කිරීමට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය , කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, පරිසර හානි සහ එහි අහිතකර ප්‍රතිඵල දැක්වෙන වාර්තා, ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අයිතිවාසිකම් හා පුරවැසි යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම දැක්වෙන පැවරුම්, ක්‍රියාකාරකම්, ප්‍රදර්ශන, භූමිකා රංගන, පුරවැසි යුතුකම් දැක්වෙන පෝස්ටර් ආදිය යොදා ගෙන නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

11.3.5 **නිපුණතා මට්ටම**

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 05යි

**ඉගෙනුම් පල**

- ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරැකීම සඳහා සලසා ඇති ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවල විකාශනය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවල වර්ධනය
  - 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීම
  - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කර තිබීම (III පරිච්ඡේදය)
  - මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග 126 වන ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබීම
  - මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීම
  - ඔම්බුඩ්ස්මන් තනතුරක් ඇති කිරීම
- ශ්‍රී ලංකාව කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගෙන ඇති පියවර
  - ශ්‍රී ලංකාව අන්තර් ජාතික කම්කරු අයිතිවාසිකම් පිළිබඳ සම්මුති කිහිපයක පාර්ශ්වකරුවෙකු වීම.

  උදාහරණ - අන්තර් ජාතික කම්කරු සංවිධානය විසින් සම්මත කොට තිබෙන ප්‍රධාන සම්මුතින්
  - කම්කරු අයිතීන් සුරැකෙන පනත් රැසක් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ව විසින් සම්මත කර තිබීම.

  උදාහරණ - කාර්මික ආරවුල් පිළිබඳ පනත<br>- මාතෘ ප්‍රතිලාභ පිළිබඳ පනත
- මානව හිමිකම් භුක්ති විඳීමේ වර්තමාන තත්ත්වය හා එහි සීමා
  - ශ්‍රී ලංකාවේ ඉහළ ම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ ඉදිරිපත් වන නඩු විසඳා අපක්ෂපාති තීරණ ලබා දී උචිත ප්‍රතිකර්ම සැලසීම
  - මානව හිමිකම් කොමිෂන් සභාව, මානව හිමිකම් කඩවීම් පිළිබඳ විමර්ශනය කර උචිත නිර්දේශ ලබා දීම
  - සමාජය දැනුවත් කිරීම
  - නිලධාරීන් දැනුවත් කිරීම
- ජාතික අධ්‍යාපන ආයතනය මගින් පාසල් හා අධ්‍යාපන විද්‍යා පීඨ විෂයමාලාවලට මානව හිමිකම් පිළිබඳ විෂය කොටස් ඇතුළත් කිරීම, විශ්ව විද්‍යාල හා වෙනත් අධ්‍යාපන ආයතනයවල විෂය නිර්දේශ මගින් මානව හිමිකම් පිළිබඳ දැනුම්වත් කිරීමට කටයුතු කිරීම
- මහජන ආරක්ෂා ව සම්බන්ධ ආයතන, ස්වේච්ඡා සංවිධාන ආදිය විසින් මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම

**මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා දක්වා ඇත. මෙම සීමාවන්ට යටත් ව අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය පුරවැසියන්ට හිමි වේ.

– රාජ්‍ය ආරක්ෂාව
– මහජන සදාචාරය
– දේශීය ආර්ථිකයට බාධා පැමිණිය හැකි අවස්ථා
– වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම අවශ්‍ය වන අවස්ථා

- මූලික අයිතිවාසිකම් භුක්ති විඳීම හා පුරවැසි යුතුකම් ඉටු කිරීම
    - අයිතිවාසිකම් භුක්ති විඳීම පිළිබඳ උනන්දු වනවා සේ ම, ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමට ද සෑම පුරවැසිකු ම කටයුතු කළ යුතු බවත්
      ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1978) 28 වන ව්‍යවස්ථාවේ ඇතුළත් මූලික යුතුකම් පිළිබඳ වත්
    - පවුල, පාසල, උසස් අධ්‍යාපන ආයතන, රැකියා ස්ථානය, සමාජය ආදි ආයතනවල සමාජිකයෙක් වශයෙන් තම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පිළිබඳ වත් අධ්‍යයනය කිරීමටත් ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1972 හා 1978

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවල වර්ධනය ගවේෂණය කිරීම සඳහා (මූලාශ්‍රය භාවිත කර) පැවරුම් ඉදිරිපත් කිරීම් වැනි ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් ක්‍රම භාවිත කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - මානව හිතවාදී පුරවැසියකු ලෙස කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** - මානව අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් පුරවැසි කාර්ය භාරය අගය කරයි.

**ඉගෙනුම් පල** • මානව අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම** - "අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමු "

**කාලයඃ** - මිනිත්තු 40යි

**ගුණාත්මක යෙදවුම්** - ඇමුණුම් 1 හි සඳහන් වගුව

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**

- පවුලේ සාමාජිකයන් වශයෙන් ලැබෙන අයිතිවාසිකම් කිහිපයක් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කර, ඒ හා බැඳුණු යුතුකම් ඉස්මතු කරන්න.
- ඒ අනුව සෑම අයිතිවාසිකමක් හා බැඳුණු යුතුකම් පවතින බව ද අවධාරණය කරන්න.

**පියවර II**

- ඇමුණුම් 1 හි සඳහන් වගුව තම අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- එම වගුව සම්පූර්ණ කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවස්ථා ව ලබා දෙන්න.
- ශිෂ්‍යශිෂ්‍යාවන් අතර ගැවසෙමින් වගු සටහන සම්පූර්ණ කිරීමට සිසුන්ට සහය වන්න.

**පියවර III**

- ශිෂ්‍යශිෂ්‍යාවන් විසින් සම්පූර්ණ කළ වගු සටහන් අතුරෙන් අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යශිෂ්‍යාවන් කිහිප දෙනෙකුට ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් කරුණු අවධාරණය වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.
- පහත දැක්වෙන ඇගයීම් හා තක්සේරු නිර්ණායක පදනම් කරගෙන ඇගයීම සිදු කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් පැහැදිලි කරයි.
- යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කරයි.
- අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ලැයිස්තු ගත කරයි.
- පවරන ලද කාර්ය මැනවින් ඉටු කරයි.
- අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අන් අය දැනුවත් කරයි.

ඇමුණුම 01

| අයිතිවාසිකම් | එම අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| 1 අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය | |
| 2 රැකියාවක් කිරීමට හා සාධාරණ වැටුප් ලැබීමට ඇති අයිතිය | |
| 3 සාමකාමී ව එක් රැස්වීමට ඇති අයිතිය | |
| 4 නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය | |

## 11.4 පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය

මිහිතලය මත ජීවන කටයුතු ඇරඹූ මුල් යුගයේ, පරිසරයට අනුකූල ව ජීවත් වෙමින් තම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට මිනිසා සමත් විය. ගොවි යුගයට පිවිසීමත් සමඟ පරිසරය තම අවශ්‍යතා ඉටු කර ගැනීමට සුදුසු පරිදි පාලනය කිරීමටත් පෙලඹුණි.

කාර්මික යුගයට පිවිසීමත් සමඟ පරිසරයට එරෙහි ව මිනිස් ක්‍රියාකාරකම් ප්‍රබල ලෙස එල්ලවන්නට විය. පරිසරයේ ඇති විවිධ සම්පත් ප්‍රයෝජනයට ගැනීමත්, පරිසරයට අහිතකර දෑ එක් කිරීමත් පෘථිවියට දරාගත නොහැකි තත්ත්වයන් බවට පත් විය.

මේ නිසා ධරණීය සංවර්ධනයේ අවශ්‍යතා ව කෙරෙහි ලෝකයේ අවධානය ප්‍රබල ලෙස යොමු වූ අතර මානව සංහතියේ පැවැත්ම සහතික කිරීමට නම් එම සංකල්පය පෘථිවි තලය මත ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව ද ඉස්මතු වන්නට විය.

ජීවයේ අනාගත පැවැත්ම සහතික කෙරෙන, තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි අනාගත පරපුරක් බිහි කර ගැනීම අරමුණු කරගෙන මෙම ඒකකය අධ්‍යයනය කිරීමට සිසුන් ව යොමු කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

• **නිපුණතාව**

පාරිසරික ගැටලු අවම කර ගනිමින් තිරසර සංවර්ධනයට දායක වෙයි.

11.4.1 **නිපුණතා මට්ටම**

පරිසරය හා මිනිසා අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 02යි

**ඉගෙනුම් පල**

- පරිසරය යන්න නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- මිනිසා හා පරිසරය අතර පවත්නා අන්තර් සබඳතාව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- පරිසරය යන්න පෙළපොතෙහි සඳහන් නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.
- පරිසරය පිළිබඳ සරල නිර්වචන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

**පරිසරයේ ප්‍රභේද**

- අජෛව පරිසරය

 අජෛව පරිසරය හෙවත් අජීවි පරිසරයේ සංරචක ලෙස, වායුගෝලය, දේශගුණය, පාෂාණ, පස්, භූ රූප, සාගර හා මිරිදිය ජලය ආදී සංරචක ඇතුළත් වේ. මිනිසා විසින් මිහිතලය මත බිහි නොකළ සියලු දෑ හා මානව නොවන්නා වූ සියල්ල අජෛව පරිසරයට අයත් වේ.

- ජෛවී පරිසරය

 පෘථිවියෙහි ඇති මිනිසා ඇතුලු සත්තු, ශාක, ක්ෂුද්‍ර ජීවී කොටස් ඇතුළත් ඉතා තුනී ස්තරයක් ලෙස ජෛව පරිසරය ව්‍යාප්ත ව ඇත. ජීවීන් විසින් අයත් කරගනු ලබන හා ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ශාක හා සත්ත්ව කොටස් මෙයට ඇතුලත් වේ.

- සමාජ පරිසරය

 උදාහරණ - ආගම, කුල පන්ති, සිරිත්විරිත්, සදාචාරය,

 විවාහ ක්‍රම, සමාජ පරිසරය මිනිසාගේ මැදිහත් වීමෙන් ගොඩ නැඟේ.

- මිනිසා හා පරිසරය අතර අන්තර්සම්බන්ධතාවක් පවතින බව

 –ස්වාභාවික පරිසරය මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය බව

 උදාහරණ - වාතය, ජලය, ශාක

 – ආහාර නිපදවා ගැනීමට භෞතික පරිසරය අත්‍යවශ්‍ය වීම

 - පරිසරයෙන් තොර ව මිනිසාට පැවැත්මක් නොමැති බව

 - මිනිසා ද පරිසරයේ කොටසක් බව

නිදසුන් ගෙන හැර දක්වමින් මෙම කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කරන්න. පරිසරය පිළිබඳ ධනාත්මක ආකල්ප සංවර්ධනය වන පරිදි මෙම විෂය කරුණු සාධනය කිරීමට පියවර ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

පරිසරය පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචන, පරිසරය හා මිනිසා අතර සම්බන්ධතාව පෙන්නුම් කරන ඡායාරූප, චිත්‍ර, පරිසරය හා මිනිසා අතර සබඳතාව පෙන්නුම් කරන වීඩියෝ පටයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සුදුසු ඇගයීම් ප්‍රභේදයක් භාවිත කර නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

11.4.2 **නිපුණතා මට්ටම**

පරිසරයට ඇති තර්ජන හා ඒවායේ සමාජ බලපෑම පිළිගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 02යි

**ඉගෙනුම් පල**

- වත්මන් පාරිසරික ගැටලු හඳුනා ගෙන ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- පාරිසරික ගැටලු කෙරෙහි වන සමාජ බලපෑම් නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- පරිසර දූෂණය නිසා ඇති වන ප්‍රතිඵල නිදසුන් දක්වමින් විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- පාරිසරික ගැටලු හඳුනා ගැනීම
  - ශාක හා සත්ත්ව ප්‍රජාවේ පැවැත්මට අහිතකර අන්දමින් පරිසර තත්ත්ව වෙනස් වීම පාරිසරික ගැටලු ලෙස සරල ව හඳුන්වන්න.
  - අහිතකර ලෙස පරිසරයේ ඇති ස්වාභාවික දෑ ඉවත් කිරීම හා අහිතකර දෑ එකතු කිරීම පාරිසරික ගැටලුවලට බොහෝ දුරට හේතු වන බව පැහැදිලි කරන්න.
- පාරිසරික ගැටලුවල සමාජ බලපෑම හඳුනා ගැනීම

  සම්පත් ක්ෂයවීම - ඛනිජ තෙල්, අඟුරු, යපස් වැනි සම්පත් අධික ලෙස භාවිතය නිසා සම්පත් ක්ෂය වීම

  - සම්පත් ක්ෂය වීම නිසා ඇතිවන ප්‍රතිඵල

    උදාහරණ - අනාගත අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී ගැටලු මතුවීම

- භෞතික පරිසරයට සිදු වන හානි
  - ජල ගෝලයට සිදු වන හානි සහ ඒ සඳහා වන මානව බලපෑම්

    උදාහරණ - කර්මාන්ත ශාලාවල අපද්‍රව්‍ය ජලාශවලට මුදා හැරීම

    ජල මූලාශ්‍රවලට හානි කිරීම
- ශිලා ගෝලයට සිදු වන හානි හා ඒ සඳහා වන මානව බලපෑම්

  උදාහරණ - පතල් කැණීම් මඟින් ඛනිජ තෙල්, ගල්අඟුරු, යපස්, මිනිරන් වැනි විවිධ ඛනිජ වර්ග අසීමිත ලෙස ප්‍රයෝජනයට ගැනීම
- භූමි පරිභෝජනය සම්බන්ධයෙන් සිදු වන හානි හා ඒ කෙරෙහි වන මානව බලපෑම
  - භූමිය මත සිදු කරන ඉදි කිරීම්

    උදරහරණ - කර්මාන්ත, මහා මාර්ග, සංවර්ධන ව්‍යාපෘති
  - කෘෂි කාර්මික කටයුතු සඳහා වන වැස්ම ඉවත් කිරීම
  - වගා කටයුතු සඳහා රසායන පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, කෘමි නාශක භාවිතය
  - දිරාපත් නොවන අප ද්‍රව්‍ය පොළොව මත බැහැර කිරීම
  - කාර්මික අපද්‍රව්‍ය තැන්පත් කිරීම
- වායුගෝලය සම්බන්ධයෙන් සිදු වන හානි ඒ කෙරෙහි වන මානව බලපෑම

  උදාහරණ - කර්මාන්තශාලා සහ වාහනවලින් පිටවන දුම්

  - ගොවිපළවලින් පිටවන මීතේන් වායුව

- දේශගුණය
  - කෘෂිකර්මය හා කර්මාන්ත හේතුකොට ගෙන වායුගෝලයට වන බලපෑම්
    උදාහරණ - වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
- ජෛව පරිසරය හා සමාජ පරිසරය
  - විවිධ මිනිස් ක්‍රියාකාරකම් මත ජෛවීය පරිසරය වෙනස් කිරීම
  උදාහරණ - ජනාවාස ඉදි කිරීම
  - වගා කටයුතු සඳහා බිම් හෙළිපෙහෙලි කිරීම
- සමාජ පරිසරය
  - උපතින් සමාන වුව ද සමාජය තුළ ඇති විවිධ භේදවලට අනුගත වීමට සිදු වීම
  - සමාජ සම්මත සිරිත්විරිත් හා සදාචාරයට ගරු නොකිරීම
  - පවුල් සංස්ථාවේ බිඳ වැටීම
- පරිසර දූෂණය නිසා ඇති වන ප්‍රතිඵල
  - ජලය දූෂණය නිසා ඇති වන හානිකර ප්‍රතිඵල
  - ශිලා ගෝලය දූෂණය නිසා ඇති වන හානිකර ප්‍රතිඵල
  - සම්පත් ක්ෂය වීම නිසා ඇති වන හානිකර ප්‍රතිඵල
  - වායු දූෂණය නිසා ඇති වන හානිකර ප්‍රතිඵල
  - දේශගුණික වෙනස්වීම් නිසා ඇති වන හානිකර ප්‍රතිඵල
  - ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇති වන ප්‍රතිඵල
  - සමාජ පරිසරයට හානි පැමිණිම නිසා ඇති වන ප්‍රතිඵල

පරිසරය හා මිනිසා අතර ඇති සබඳතා ව, පරිසර හානි කෙරෙහි වන මානව බලපෑම්, පරිසර දූෂණය නිසා ඇති වන ප්‍රතිඵල නිදසුන් සහිත ව අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. එමෙන් ම පරිසරයට සංවේදී වීම හා පරිසරය සංරක්ෂණය කෙරෙහි ධනාත්මක ආකල්ප හා කුසලතා ගොඩ නැගෙන අයුරින් සිසුන් අධ්‍යයන කාර්යයට යොමු කිරීම ද මෙහි මූලික අපේක්ෂාව වේ.

**ගුණාත්මක යෙදවුම්**

පුවත්පත් වාර්තා (පරිසර දූෂණය, සම්පත් ක්ෂය වීම ආදියට සම්බන්ධ ) පරිසර පුවත් ඇතුළත් සඟරා, වීඩියෝ දර්ශන

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

"පරිසර දූෂණය හා එහි අහිතකර ප්‍රතිවිපාක" මැයෙන් වාක්‍ය රචනයක් ලිවීමට සලස්වා ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

11.4.3 **නිපුණතා මට්ටම**

සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු හා ඒවාට විසඳුම් විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 08යි

**ඉගෙනුම් පල**

- සංවර්ධන සංකල්පය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.
- සංවර්ධිත හා සංවර්ධන වෙමින් පවත්නා රටවල ලක්ෂණ වගුගත කරයි.
- සංවර්ධන ක්‍රියාවලියේ දී රටවල් මුහුණපාන ගැටලු විස්තර කරයි.
- සංවර්ධනය වෙමින් පවත්නා රටවල ගැටලු විසදා ගැනීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- සංවර්ධනය පිළිබඳ පෙළ පොතෙහි ඉදිරිපත් කර ඇති නිර්වචන අධ්‍යයන කිරීමට සිසුන් යොමු කරන්න.
- සංවර්ධනය යන සංකල්පය කලින් කලට වෙනස් වන ගතික සංකල්පයක් බවත් වර්තමානයේ "සංවර්ධනය" යන සංකල්පය මඟින් විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කර ඇති බවත් අවබෝධ කර ගැනීමට ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- සංවර්ධනය පිළිබඳ විද්වතුන් ඉදිරිපත් කර ඇති නිර්වචන ඇසුරින් සංවර්ධනය යන්නෙහි අදහස ප්‍රකාශ වන පරිදි සරල නිර්වචනයක් ගොඩනැගීමට ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.

- **සංවර්ධනය මැනීම**

සංවර්ධනය මැන බැලීමේ අවශ්‍යතාව

- එක ම රටක විවිධ අවධිවල පවතින සංවර්ධන විෂමතා හඳුනා ගැනීම
- රටක දක්නට ලැබෙන ආර්ථික, සමාජ හා සදාචාරාත්මක ගැටලු හඳුනා ගැනීම
- හඳුනාගත් ගැටලු අවම කර ගැනීමට ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම
- රටේ ආර්ථික, සමාජ, සංස්කෘතික හා සදාචාරාත්මක දියුණුව සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- වෙනත් රටවල් සමඟ සංවර්ධන මට්ටම සැසඳීම
- ඉදිරි වර්ෂය සඳහා ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම

- සංවර්ධනය මැනීම සඳහා භාවිතා වන මිනුම් හැඳින්වීම

සංවර්ධන මැනීම සඳහා භාවිත වන මිනුම් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

1 සම්ප්‍රදායික මිනුම්

2 නූතන මිනුම්

- **සම්ප්‍රදායික මිනුම්**
  - ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය

$$\text{ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය} = \frac{\text{දළ ජාතික ජාතික නිෂ්පාදිතය}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}}$$

$$\text{දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය} = \frac{\text{අදාළ වසරේ දළ ජාතික නිෂ්පාදිතය} - \text{පසු ගිය වසරේ දළ ජාතික නිෂ්පාදිතය}}{\text{පසු ගිය වසරේ දළ ජාතික නිෂ්පාදිතය}} \times 100$$

මූර්ත දළ ජාතික නිෂ්පාදිතය

$$\text{මූර්ත දළ ජාතික නිෂ්පාදිතය} = \frac{\text{මුල්‍ය දළ ජාතික නිෂ්පාදිතය}}{\text{ගම්‍ය මිල දර්ශකය}} \times 100$$

**නූතන මිනුම්**

නූතන මිනුම් හා ඒවාට අදාළ සංරචක පහත දැක්වේ.

| **මිනුම** | **සංරචක** |
|---|---|
| භෞතික ජීවන තත්ත්ව දර්ශකය P.Q.L.I | සාක්ෂරතාව |
| | ළදරු මරණ අනුපාතය |
| | උපතේ දී ආයු අපේක්ෂාව |
| මානව සංවර්ධන දර්ශකය H.D.I | ආයු අපේක්ෂණ දර්ශකය |
| | අධ්‍යාපන දර්ශකය |
| | ආදායම් දර්ශකය |

- **සංවර්ධනය මැනීම සඳහා භාවිත වන මිනුම්වල කාර්යක්ෂම බව**
  - සම්ප්‍රදායික මිනුමක් ලෙස ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ අඩු පාඩු
  - ආර්ථිකමය වූ තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම
  - සමාජමය තත්ත්වය පෙන්නුම් නොකිරීම
  - ආදායම් බෙදී යාමේ විෂමතාව පෙන්නුම් නොකිරීම
  - සමාජ සුභසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීම
- සමාජ සංවර්ධනය මැනීම සඳහා නූතන මිනුමක් ලෙස භෞතික ජීවන තත්ත්ව දර්ශකය යොදා ගනියි. මෙය සංවර්ධනය මැනීමේ දී ඒක පුද්ගල ආදායමේ ඌන පූරකයක් ලෙස භාවිත වේ.
- මානව සංවර්ධන දර්ශකය ආර්ථික හා සමාජ යන අංග දෙක ම මැන ගැනීමට උපකාරී වේ.

- සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට නිදසුන් හා එම රටවල ලක්ෂණ

| **සංවර්ධිත රටවලට නිදසුන්** | **සංවර්ධිත රටවල ලක්ෂණවලට නිදසුන්** |
|---|---|
| නෝර්වේ | ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 3500කට වැඩි වීම |
| ස්වීඩනය | භෞතික ජීවන තත්ව දර්ශකය 90ට වඩා වැඩි වීම |
| කැනඩාව | ජනසංඛ්‍යා වර්ධනය පහළ මට්ටමක පැවතීම |
| ජපානය | ඉහළ සාක්ෂරතා ප්‍රතිශතයක් පැවතීම |
| ඇමෙරිකා එක්සත් ජනපදය | ළදරු මරණ අනුපාතය අඩු වීම |
| ඕස්ට්‍රේලියාව | මානව සංවර්ධන දර්ශකය 0.80ට වඩා වැඩි වීම |

- සංවර්ධනය වෙමින් පවත්නා රටවලට නිදසුන් සහ එම රටවල දක්නට ලැබෙන ලක්ෂණ

| **සංවර්ධනය වෙමින් පවත්නා රටවලට නිදසුන්** | **සංවර්ධනය වෙමින් පවත්වන රටවල දක්නට ලැබෙන ලක්ෂණවලට නිදසුන්** |
|---|---|
| ඉන්දියාව | භෞතික ජීවන තත්ත්ව දර්ශකය පහළ මට්ටමක පැවතීම |
| නේපාලය | ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 3500කට වඩා අඩු වීම |
| භූතානය | මානව සංවර්ධනය දර්ශකය පහළ මට්ටමක පැවතීම |
| ඉතියෝපියාව | ජන සංඛ්‍යා වර්ධනය වේගය ඉහළ මට්ටමක පැවතීම |
| සෝමාලියාව | මානව සංවර්ධන දර්ශකය 0.50ට වඩා අඩු වීම |

| **සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලුවලට නිදසුන්** | **සංවර්ධනය වෙමින් පවත්නා රටවල් මුහුණපාන ගැටලුවලට නිදසුන්** |
|---|---|
| - පරිසර දූෂණය | - පරිසර දූෂණය |
| - අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා | - නිෂ්පාදිත අමු ද්‍රව්‍ය සඳහා හොඳ මිලක් නොලැබීම |
| - ඛනිජ තෙල් මිල ඉහළ යාම | - අවාසිදායක වෙළෙඳ ශේෂය |
| - නිමි ද්‍රව්‍ය අලෙවි කර ගැනීම පිළිබඳ අපහසුතා | - ප්‍රාග්ධන හිඟය |
| - ජාත්‍යන්තර ත්‍රස්තවාදය | - විරැකියාව |
| | - දේශපාලන අස්ථාවරත්වය |
| | - බලශක්ති අර්බුදය |


- සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ විශේෂත්වය (නිදසුන්)
  - සංවර්ධිත රටවලට සාපේක්ෂ ව බලන විට ඉහළ සාක්ෂරතා මට්ටමක් පැවතීම
  - ළදරු මරණ, මාතෘ මරණ අනුපාතය පහළ මට්ටමක් පැවතීම
  - ජීවන අපේක්ෂාව ඉහළ මට්ටමක පැවතීම

- සංවර්ධනය ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු
  - ප්‍රාග්ධන ඌනතාව
  - ප්‍රාථමික භාණ්ඩවල මිළ උච්චාවචනය
  - ආනයනය කරන භාණ්ඩ සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදු වීම
  - අවාසිදායක වෙළෙඳ ශේෂය

- අන්තර්ජාතික වෙළෙඳාමේ දී සංවර්ධිත රටවල් අනුගමනය කරන ආරක්ෂණ පිළිවෙත්
  උදාහරණ - තීරු බදු, සලාක ක්‍රම
- බලශක්ති අර්බුදය
  - බුද්ධි ගලනය - (බුද්ධිමතුන් විදේශගත වීම)

සංවර්ධනය වෙමින් පවත්නා රටවල ක්‍රියාත්මක වන දිළිඳු බව එලෙසින් ම පැවතීමට හේතු වන කරුණු දිළිඳු බවේ විෂම චක්‍රය රූප සටහන ඇසුරින් පැහැදිලි කරන්න.

**දිළිඳු බවේ විෂම චක්‍රය**




- සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු සඳහා විසඳුම්
  - විදේශාධාර ලබා ගැනීම
  - දේශීය ඉතුරුම් සඳහා දිරි ගැන්වීම්
  - අපනයන විවිධාංගීකරණය
  - නව වෙළෙඳපොළ සොයා ගැනීම
  - ආයාත ආදේශන ප්‍රතිපත්ති අනුගමනය කිරීම
  - විකල්ප බලශක්ති හඳුන්වා දීම හා භාවිතයට යොමු වීම

**ගුණාත්මක යෙදවුම්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ විෂය අන්තර්ගතයට අදාළ කරුණු, විෂය අන්තර්ගතයට අදාළ පුවත් පත් වාර්තා, එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන වාර්තා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සංවර්ධනය මැනීමේ දර්ශක, ඒවායේ ප්‍රයෝජන, සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ විශේෂත්වය හඳුනා ගැනීම මැන බැලීමට සුදුසු පැවරුමක් ලබා දී ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

11.4.4 **නිපුණතා මට්ටම**

තිරසර සංවර්ධනය උදෙසා පරිසරය සුරැකීමේ වැදගත්කම හඳුනා ගනිමින් පාරිසරික ගැටලුවලට විසඳුම් ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 08යි

**ඉගෙනුම් පල**

- තිරසර සංවර්ධනය සංකල්පය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- තිරසර සංවර්ධනයේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.
- තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුද්ගල, රජයේ හා විවිධ සමාජ ආයතනවල වගකීම් හා යුතුකම් විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- " තිරසර සංවර්ධනය" සංකල්පය හැඳින්වීම
  - තිරසර සංවර්ධන සංකල්පය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති නිර්වචන
  - පෙළපොතෙහි සඳහන් නිර්වචන ඇසුරින් තිරසර සංවර්ධනය පිළිබඳ සරල නිර්වචන ඉදිරිපත් කිරීමට ශිෂ්‍යාශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දෙන්න.
- තිරසර සංවර්ධනයේ වැදගත්කම හෙවත් අවශ්‍යතාව

* වර්තමානයේ තිරසර සංවර්ධනය අවශ්‍ය වීමට පහත නිදසුන් ලෙස දක්වා ඇති කරුණු හේතු වන ආකාරය සිසුන්ගේ අවධානයට යොමු කරන්න.

- පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් කටයුතු කිරීම නිසා සුභසාධන කාර්යයන්ට අඩු වැදගත්කමක් හිමි වීම

උදාහරණ - නිෂ්පාදිත වානිජ්‍යකරණය වීම තුළ ලාභ අපේක්ෂාවෙන් කටයුතු කිරීම නිසා අහිතකර නිෂ්පාදන වෙළෙඳපොළට ගලා ඒම, ආර්ථික හා ඉලක්ක සපුරා ගැනීමට යාම තුළ පරිසරය නොසලකා හැරීම

- කෙටිකාලීන ව අවශ්‍යතා සපුරා ගැනීමට පෙලඹීම නිසා ඇති වන අහිතකර ප්‍රතිඵල

උදාහරණ - වනාන්තර විනාශ වීම, සම්පත් අධිපරිභෝජනය, නල ළිං ඉදි කිරීම

- සංවර්ධන ක්‍රියාවලියේ දී ආර්ථික සංවර්ධනය, පරිසර සමතුලිතාව හා එක් ව ගමන් නොකිරීම
- පරිසරය හිතකාමී තාක්ෂණික ක්‍රමවේද යොදා නොගැනීම

උදාහරණ - කර්මාන්ත ශාලාවලින් පිටවෙන දුම්, අපවිත්‍ර ජලය, පරිසරයට මුදා හැරීම

- සමාජ පිරිවැය ඉහළ යාම

උදාහරණ - අප ද්‍රව්‍ය අවිධිමත් ව පරිසරයට මුදා හැරීම

වර්තමානයේ උද්ගත ව ඇති මෙම ගැටලු පිළිබඳ සිසු අවධානය යොමුකර, තිරසර සංවර්ධනයේ අවශ්‍යතාව හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

- තිරසර සංවර්ධනය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

උදාහරණ - සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී පරිසර හානි අවම වන අන්දමින් සැලසුම් කිරීම

- පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිපදවීමට නිෂ්පාදකයන් දිරි ගැන්වීම
- පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා පරිභෝජනයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම

- පරිසර සංරක්ෂණයට අදාළ නීති සම්පාදනය
- තිරසර සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ ජනතා ව දැනුම්වත් කිරීම
- අධිපරිභෝජනය සීමාකර වන පරිසර හිතකාමී ජීවන ක්‍රමයකට ජනතා යොමු කිරීම

• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්
- පරිසර හිතකාමී ජීවන රටාවකට හුරු වීම
- අධි පරිභෝජනයෙන් වැළකීම
- පරිසර හිතකාමී ආකල්ප වර්ධනය කර ගැනීම
- නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම
- භෞතික පරිසරයට හානිකර ක්‍රියාකාරකම්වලින් වැළකීම
- සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය
- තිරසර සංවර්ධනයේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ සමාජය දැනුම්වත් කිරීම

• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් විවිධ ආයතනවල හා සංවිධානවල වගකීම් හා යුතුකම්
- පරිසර හානි පිළිබඳ සංවේදී වීම, ඒ පිළිබඳ සොයා බැලීම, තොරතුරු රැස් කිරීම හා අදාළ ඒ පිළිබඳ වගකිව යුතු ආයතන දැනුම්වත් කිරීම
- තිරසර සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම
- සරල දිවි පැවැත්මට අදාළ සිතුම් පැතුම් හා චර්යා, සමාජගත කිරීමට දායක වීම
- මිනිස් පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ හා සේවා පරිහරණය අවම කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

• තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් රජයේ වගකීම් හා යුතුකම්
- පරිසරය සුරැකීම පිළිබඳ ව ජනතා දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනයට පියවර ගැනීම
- දිළිඳුකම පිටු දැකීම සඳහා පියවර ගැනීම
- නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිභෝජනය සම්බන්ධයෙන් පවතින අසමතුලිතා අවම කිරීම
- තිරසර සංවර්ධනයට දායක වන ඵලදායි පාරිසරික නීතිරීති හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- පරිසර හිතකාමී නොවන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අවම කිරීමට කටයුතු කිරීම

**ගුණාත්මක යෙදවුම්**

පරිසර හානි දැක්වෙන පුවත්පත් වාර්තා, පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ ප්‍රවෘත්ති වාර්තා, ස්වාභාවික වනාන්තර, වනසතුන්, දිය ඇලි, ගංගා ආදියේ ඡායාරූප

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

තිරසර සංවර්ධනය සඳහා පුරවැසියන්ගේ කාර්යභාරය මැයෙන් පුවත්පතකට යැවීමට සුදුසු ලිපියක් සකස් කිරීමට සලස්වා ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - පාරිසරික ගැටලු අවම කර ගනිමින් තිරසර සංවර්ධනයට දායක වෙයි.

**නිපුණතා මට්ටම** - තිරසර සංවර්ධනය උදෙසා පරිසරය සුරැකීමේ වැදගත්කම හඳුනා ගනිමින් පාරිසරික ගැටලුවලට විසඳුම් ගවේෂණය කරයි.

**ඉගෙනුම් පල** • තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුද්ගල, රජයේ හා විවිධ සමාජ ආයතනවල වගකීම් හා යුතුකම් විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - "තිරසර සංවර්ධනය උදෙසා පුද්ගල වගකීම් ඉටු කරමු "

**කාලයː** - මිනිත්තු 40යි

**ගුණාත්මක යෙදවුම්** - ඇමුණුම් 11.4.4.1ට අදාළ කාර්ය පත්‍රිකාව, A4 කඩදාසි
අනිසි ලෙස අප ද්‍රව්‍ය බැහැර කර ඇති ස්ථානයක් දැක්වෙන ඡායා රූපයක්/චිත්‍රයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**

- අනිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කර ඇති ස්ථානයක් දැක්වෙන ඡායා රූපයක්/පින්තූරයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- මේ නිසා ඇති වන අයහපත් ප්‍රතිඵල ශිෂ්‍යශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කරන්න. පරිසරය සංරක්ෂණය කිරීමට දායක වීම සෑම පුරවැසියකුගේ ම වගකීමක් බව අවධාරණය වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.

**පියවර II**

- පන්තියේ ශිෂ්‍යශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- කාර්ය නිම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබා දෙන්න.

**පියවර III**

- සකස් කරන ලද ලිපි පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් කරුණු අවධාරණය වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.
- සංශෝධනය සිදු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.
- පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

- කසල නිසි ලෙස බැහැර කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- පරිසර හිතකාමී පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග අගය කරමින් අදහස් දක්වයි.
- පරිසර සංරක්ෂණය පිළිබඳ සෙසු අය දැනුවත් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කරයි.
- ගුරු උපදෙස් පිළිපදිමින් කටයුතු කරයි.

ඇමුණුම 11.4.4.1 - කාර්ය පත්‍රිකා

කාර්ය පත්‍රිකා අංක I

- පහත දැක්වෙන අනුමාතෘකා යටතේ බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න

ඔබ නිවසේ එදිනෙදා එක් රැස් වන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග

එසේ කිරීම නිසා අත් වන යහපත් ප්‍රතිඵල

(ඔබ කණ්ඩායම සකස් කළ ලිපිය පන්තියට ඉදිරිපත් කිරීමෙන් පසු සංශෝධන තිබේ නම් ඇතුළත් කරන්න.)

- ඔබේ නිර්මාණය බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

කාර්ය පත්‍රිකා අංක II

- පහත දැක්වෙන අනුමාතෘකා යටතේ බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.
- පහත දැක්වෙන එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ හැකි ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න.
    - බලශක්තිය
    - ප්‍රවාහන අවශ්‍යතා

එසේ කිරීම නිසා අත් වන යහපත් ප්‍රතිඵල

- මෙම ලිපිය පන්තියට ඉදිරිපත් කිරීමෙන් පසු අවශ්‍ය සංශෝධන තිබේ නම් ඒවා ඇතුළත් කරන්න.
- ඔබේ නිර්මාණය බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

කාර්ය පත්‍රිකා අංක III

පහත මාතෘකාවට අදාළ ව බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.

- පරිසර හිතකාමී ජීවන රටාවකට හුරු වීම සඳහා ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග
- එම ලිපිය පන්තියට ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය සංශෝධන තිබේ නම් ඒවා ඇතුළත් කරන්න.
- ඔබේ නිර්මාණය බිත්ති පුවත් පතෙහි ප්‍රදර්ශනය කරන්න.

## 11.5 ජාත්‍යන්තර සබඳතා

මිනිස් ඉතිහාසය දෙස බලන විට ඈත අතීතයේ ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හුරු වූ ජන සමාජයක් පැවති බව සඳහන් වේ. එම සමාජ ක්‍රමය තුළ ද බොහෝ රාජ්‍ය අතර සබඳතා පැවති බවට ඉතිහාසයෙන් සාක්ෂි හමු වේ.

කාර්මික විප්ලවයෙන් පසු අමුද්‍රව්‍ය ලබා ගැනීම හා නිමි ද්‍රව්‍ය අලෙවි කර ගැනීම අරමුණු කර ගෙන ලෝකයේ රටවල් අතර වෙළෙඳ සබඳතා වර්ධනය වන්නට විය. ඉන් පසු ව ඇති වූ II වන ලෝක යුද්ධය විශාල මිනිස් ජීවිත සංඛ්‍යාවක් බිලිගත් අතර දේශපාලන, ආර්ථික හා සමාජීය ගැටලු රාශියක් ඇති කිරීමට ද හේතු විය.

නැවත ලෝක යුද්ධයක් ඇති වීම වැළැක්වීමටත්, ජාතීන් අතර සාමය හා සමඟිය ගොඩ නැගීම සඳහාත් ප්‍රබල ජාත්‍යන්තර සංවිධානයක අවශ්‍යතාව ඉස්මතු වන්නට විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි විය. ඉන් අනතුරු ව ජාතීන් අතර සහයෝගිතාව ගොඩ නැගීම හා ආර්ථික, සමාජීය සහයෝගිතාව අරමුණු කර ගෙන ජාත්‍යන්තර හා ප්‍රාදේශීය සංවිධාන රැසක් බිහි විය. ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කර ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ උපාය මාර්ග ද ක්‍රියාත්මක වන්නට විය.

ප්‍රවාහනය හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ ලෝකයේ රටවල් අතර සබඳතා තවදුරටත් ශීඝ්‍රයෙන් සංවර්ධනය වන්නට විය.

ජාත්‍යන්තර සබඳතා සඳහා ආධාර වන ජාත්‍යන්තර හා ප්‍රාදේශීය සංවිධාන පිළිබඳ වත් රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ග පිළිබඳවත් අධ්‍යයනය කිරීමට ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දීම මෙම පරිච්ඡේදය තුළින් අපේක්ෂා කෙරේ.

• **නිපුණතාව**

11.5 ලෝක සමාජයේ සාමාජිකයෙකු ලෙස ඵලදායි ව ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම**

11.5.1 ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත්කම අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 02යි

**ඉගෙනුම් පල**

- ජාත්‍යන්තර සම්බන්ධතා යන්න කෙටියෙන් පැහැදිලි කරයි.
- ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත්කම විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

• ජාත්‍යන්තර සම්බන්ධතා අර්ථ දැක්වීම

"ජාතීන් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව" ජාත්‍යන්තර සබඳතා ලෙස සරල ව හැඳින්විය හැකි ය.

මෙම සබඳතා පැවතිය හැකි ආකාර

- රාජ්‍ය හා රාජ්‍ය අතර
- රාජ්‍ය හා සංවිධාන අතර
- රාජ්‍ය හෝ සංවිධාන පුද්ගලයන් සමඟ

• ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත්කම

- අතීතයේ ස්වයං පෝෂිත අර්ථක්‍රමයක් පැවති නිසා රාජ්‍යයන් හුදකලාව පැවතිය ද ජන සංඛ්‍යාව වැඩි වීමත් අවශ්‍යතා සංකීර්ණ වීමත් සමඟ ම රාජ්‍යයන්ට තනි ව පැවතිය නොහැකි වීම
- දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය වශයෙන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සබඳතා පුළුල් කර ගත හැකි වීම
- ප්‍රබල රාජ්‍යවලින් ඇති කරන බලපෑම්වලින් ආරක්ෂා වීම සඳහා
- ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇති වන බාධා මඟහරවා ගැනීම සඳහා

**ගුණාත්මක යෙදවුම්**

ලෝක සිතියම, විවිධ ජාත්‍යන්තර සංවිධාන (උදාහරණ එක්සත් ජාතීන්, පොදු රාජ්‍ය මණ්ඩලය ... වැනි )

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

රටක පැවැත්ම සඳහා ජාත්‍යන්තර සම්බන්ධතා වැදගත් වන ආකාරය සම්බන්ධයෙන් ශිෂ්‍යශිෂ්‍යාවන් අතර සංවාදයක් ගොඩනගා ශිෂ්‍ය ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.5.2 ජාත්‍යන්තර සම්බන්ධතාවල වර්තමාන තත්ත්වය හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන විවිධ බලපෑම් ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 02යි

**ඉගෙනුම් පල**

- ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට බලපෑ හේතු නම් කරයි.
- ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය විස්තර කරයි.
- ජාත්‍යන්තර සබඳතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම් පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමෙහිලා බලපෑ සාධක
  - සම්පත් විසංතුලනය
  - රටක අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම
  - අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම
  - ප්‍රවාහනය හා සන්නිවේදන ක්‍රම දියුණු වීම
  - දියුණු තාක්ෂණය ලබා ගැනීමේ අවශ්‍යතාව
  - හදිසි ආපදා හා විවිධ අවස්ථාවල දී සහන ලබා ගැනීම
  - දේශපාලන, සමාජීය හා සංස්කෘතික සබඳතා වැඩි දියුණු කර ගැනීම
- ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය
  - දෙවන ලෝක යුද්ධයෙන් පසු රාජ්‍ය අතර සම්බන්ධතා ශීඝ්‍ර ලෙස වර්ධනය විය.
  - වර්තමානයේ ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති අතර ජාත්‍යන්තර සම්බන්ධතා ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත.
  - ශ්‍රී ලංකාව මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ලෝකයේ රටවල් සමඟ සබඳතා පවත්වා ගෙන යෑම
- ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම්
  - ආනයන අපනයන කටයුතු

    උදාහරණ:- සමහර රටවල් අපනයන මිල දී ගැනීම සීමා කිරීම
  - විවිධ කොන්දේසි පැනවීම, සලාක ක්‍රම ඇති කිරීම, තීරු බදු ඉහළ නැංවීම,
  - ණය හා ආධාර ලබා ගැනීම
    - ණය සැපයීමේ දී විවිධ කොන්දෙසි පැනවීම

    උදාහරණ:- I ණය සපයන රට විසින් නියම කරන පරිදි යන්ත්‍ර, සූත්‍ර වෙනත් ප්‍රාග්ධන භාණ්ඩ එම රටින් ලබා ගැනීමට සිදු වීම (ඇතැම් විට මානව සම්පත්, ශ්‍රමය පවා)

    II ණය සැපයීමේ දී ණය ලබා දෙන රට විසින් නියම කරනු ලබන ව්‍යාපෘති සඳහා ම එම ණය යොදා ගැනීමට සිදු වීම
  - රැකියා සැපයීම

    උදාහරණ- රැකියා සැපයීම සීමා කිරීම, ප්‍රේෂණ සඳහා කොන්දේසි පැනවීම, අවම සුදුසුකම් නියම කිරීම

**ගුණාත්මක යෙදවුම්**

විදේශ ණය හා ආධාර ලබා දීම තුළින් සිදු කරන ලද ව්‍යාපෘති දැක්වෙන පින්තූර.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සංවර්ධන ක්‍රියාවලිය සඳහා විදේශ ණය හා ආධාර ලබා ගැනීම කොතෙක් දුරට ඵලදායක ද යන්න පිළිබඳ ව ශිෂ්‍යශිෂ්‍යාවන් සංවාදයකට යොමු කරවා ඉදිරිපත් කරන අදහස් හා ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.5.3 තෝරාගත් කලාපීය හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරීත්වය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 08යි

**ඉගෙනුම් පල**

- කලාපීය සංවිධාන පිළිබඳ පැහැදිලි කරයි.
- ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ විස්තර කරයි.
- තෝරාගත් සංවිධාන කිහිපයක සේවය අගය කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- කලාපීය සංවිධාන
- සාක් සංවිධානය
  - ආරම්භය
  - සාමාජික රටවල්
  - අරමුණු
  - සාමාජික රටවල ආර්ථික, සමාජීය හා සංස්කෘතික සංවර්ධනය සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග
- ආසියාන් සංවිධානය
  - ආරම්භය
  - සාමාජික රටවල්
  - අරමුණු
- කොළඹ ක්‍රමය
  - ආරම්භය
  - සාමාජික රටවල්
  - අරමුණු
- බිම්ස්ටෙක්
  - ආරම්භය
  - සාමාජික රටවල්
  - අරමුණු
- **ජාත්‍යන්තර සංවිධාන**
  - එක්සත් ජාතීන්
    - ආරම්භය
    - ආරම්භක පුරෝගාමීන්
    - අරමුණු
    - සංවිධාන ව්‍යුහය, ප්‍රධාන ආයතන හා ඒවායේ කාර්යභාරය

* එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන හා ඒවායේ සාමාජිකයන්ගේ බලතල හා කාර්ය පෙළපොතේ සඳහන් පරිදි ශිෂ්‍යශිෂ්‍යාවන් සමඟ සාකච්ඡා කරන්න.

එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන

- මහා මණ්ඩලය
- ආරක්ෂක මණ්ඩලය
- ආර්ථික හා සමාජ මණ්ඩලය

- භාරකාර මණ්ඩලය
- අන්තර්ජාතික අධිකරණය
- ලේකම් කාර්යාලය
- එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන

පහත දැක්වෙන ආයතනවල ආරම්භය, අරමුණු සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉටු කර ඇති සේවා කෙටියෙන් පැහැදිලි කරන්න.

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- යුනෙස්කෝ
- යුනිසෙෆ්
- උන්ක්ටාඩ්
- ලෝක කම්කරු සංවිධානය
- ලෝක වෙළෙඳ සංවිධානය
- ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව (ලෝක බැංකුව)
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

- පොදු රාජ්‍ය මණ්ඩලය
  - ආරම්භය
  - සාමාජිකත්වය
  - අරමුණු
  - සාමාජික රටවල් වෙනුවෙන් ඉටු කර ඇති සේවා
- නොබැඳි සමුළුව
  - ආරම්භය
  - සාමාජිකත්වය
  - අරමුණු
  - සාමාජික රටවල් වෙනුවෙන් ඉටු කර ඇති සේවා

**ගුණාත්මක යෙදවුම්**

සාක් සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවිධානය ආදියෙහි ලාංඡන දැක්වෙන පින්තූර, විස්තර පත්‍රිකා, ලිපි ශීර්ෂ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

අන්තර්ජාතික සංවිධාන පිළිබඳ ව පොත් පිංචක් සකස් කිරීමට සලස්වා (කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස) නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

11.5.4 සුවිශේෂ අරමුණු සඳහා ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමෙන්, ශ්‍රී ලංකාවට අත් වන යහපත් ප්‍රතිඵල විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 08යි

**ඉගෙනුම් පල**

- ජාත්‍යන්තර සබඳතා මාධ්‍ය නම් කරයි.
- ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත් වන ප්‍රතිඵල විග්‍රහ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.)

- තනාපති සේවය
  - තානාපති සේවය හැඳින්වීම
  - තානාපතිවරු හා රාජ්‍ය දූතයන්ගේ සේවය
  - තානාපතිවරයෙක් හෝ රාජ්‍ය දූතයෙකු තුළ තිබිය යුතු ගුණාංග
- ජාත්‍යන්තර වෙළෙඳාම
  - අවශ්‍ය වීමට හේතු
  - ජාත්‍යන්තර වෙළෙඳාමේ ස්වරූප හා ඒවාට සුවිශේෂ ලක්ෂණ
- යුද්ධය
  - යුද්ධයට බලපාන හේතු
  - යුද්ධයට, ජාත්‍යන්තර සම්බන්ධතා බලපාන ආකාරය
- විදේශාධාර
  - හැඳින්වීම
  - අවශ්‍ය වීමට හේතු
  - විදේශාධාර සපයන ක්‍රම හා ඒවාට සුවිශේෂ ලක්ෂණ
  - විදේශාධාර සපයන ජාත්‍යන්තර සංවිධාන
- සාමය
  - සාමය ගොඩනැගීම සඳහා ජාත්‍යන්තර සම්න්ධතා ආධාර වන ආකරය
  - ලෝකයේ විවිධ රටවල් සහ සංවිධාන ලෝක සාමය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග
- සංවර්ධනය
  - සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංවර්ධන ප්‍රයත්න සඳහා ජාත්‍යන්තර සහයෝගය අවශ්‍ය වන ආකාරය
  - සංවර්ධිත රටවල් ලබා ඇති සංවර්ධනය පවත්වා ගෙන යාම සඳහා ජාතන්තර සම්බන්ධතා හේතු වන ආකාරය

**ගුණාත්මක යෙදවුම්**

මෙහි දැක්වෙන විෂය කරුණු නියෝජනය වන ලිපි ශීර්ෂ, ඡායාරූප, (නිදසුන් තානාපති සේවය, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා, ජාත්‍යන්තර වෙළෙඳාම ... ආදිය)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ජාත්‍යන්තර සම්බන්ධතා මාධ්‍ය පුළුල් වීම හා ලෝක සාමය සම්බන්ධයෙන් ශිෂ්‍යයන් තුළ පුළුල් සංවාදයක් ඇති කර ඒ ඔස්සේ නිර්ණායක මූලික ව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## නිදර්ශක ක්‍රියාකාරකම

**නිපුණතාව** - ලෝක සමාජයේ සාමාජිකයෙකු ලෙස ඵලදායි ව ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට දායක වෙයි.

.

**නිපුණතා මට්ටම** - තෝරාගත් කලාපීය හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරීත්වය විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල**
- ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ විස්තර කරයි.
- තෝරාගත් සංවිධාන කිහිපයක සේවය අගය කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** - "එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහය හඳුනා ගනිමු "

**කාලයः** - මිනිත්තු 40යි

**ගුණාත්මක යෙදවුම්** - එක්සත් ජාතීන්ගේ ලාංඡනය
එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන (ව්‍යුහය) දැක්වෙන රූප සටහනක්
ඇමුණුම් 11.5.1හි සඳහන් කාර්ය පත්‍රිකා
බ්‍රිස්ටල් බෝඩ්/ඩිමයි කඩදාසි
ෆෙල්ට් පෑන්

**පූර්ව සූදානම සඳහා උපදෙස්**

- එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන පිළිබඳ පහත සඳහන් උප මාතෘකා යටතේ තොරතුරු රැස් කරන ලෙස පන්තියේ සියලු ම ශිෂ්‍යශිෂ්‍යාවන්ට පොදුවේ උපදෙස් ලබා දෙන්න.
  - එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන
  - ඒවායේ සාමාජිකත්වය හිමි වන අයුරු
  - එක් එක් ආයතනයේ බලතල හා කාර්යභාරය
- තොරතුරු රැස් කිරීමට ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- රැස්කරගත් තොරතුරු පන්තියට රැගෙන ආයුතු දිනය දැනුම් දෙන්න.
- නියමිත කාලය තුළ සිසුන් තොරතුරු රැස් කිරීමේ යෙදී සිටින්නේ ද යන්න පිළිබඳ සොයා බලා ඒ සඳහා දිරි ගන්වන්න.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර I**
- එක්සත් ජාතීන්ගේ ලාංඡනය පන්තියට ඉදිරිපත් කරන්න.
- එය හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන හා සංවිධාන ව්‍යුහය දැක්වෙන රූප සටහන පන්තියට ඉදිරිපත් කරන්න.
- එයට අදාළ ප්‍රධාන ආයතන හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර II**

• පන්තියේ ශිෂ්‍යශිෂ්‍යාවන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

• එක් එක් කණ්ඩායමට ඇමුණුම් 11.5.1 හි සඳහන් කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
• කාර්ය නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
• ශිෂ්‍යශිෂ්‍යාවන්ට අවශ්‍ය සහාය හා මඟපෙන්වීම ලබා දෙන්න.

**පියවර III**

• ශිෂ්‍යශිෂ්‍යාවන් සකස් කරන ලද තොරතුරු ඇතුළත් වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
• එක් එක් කණ්ඩායම ඉදිරිපත් කිරීම් අවසානයේ වැදගත් කරුණු අවධාරණය වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.
• පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**ඇගයීම් හා තක්සේරුකරණ නිර්ණායක**

• එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට අයත් ප්‍රධාන ආයතන නම් කරයි.
• එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනවල කාර්යයන් හා බලතල පැහැදිලි කරයි.
• එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනවල සේවා අගය කරමින් අදහස් දක්වයි.
• තොරතුරු රැස් කිරීමේ දී උනන්දුවෙන් යුතු ව කටයුතු කරයි.
• තොරතුරු නිර්මාණශිලී ව ඉදිරිපත් කර, ඒ පිළිබඳ සෙසු අය දැනුම්වත් කරයි.

ඇමුණුම 11.5.1 - කාර්ය පත්‍රිකා

කාර්ය පත්‍රිකා අංක I

• එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට අයත් මහා මණ්ඩලය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ වාර්තාවක් සකස් කරන්න.
  - සාමාජිකත්වය
  - බලතල හා ඉටු කරනු ලබන කාර්යයන්
• එම වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකා අංක II

• එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ වාර්තාවක් සකස් කරන්න.
  - ප්‍රධාන නිලධාරියා
  - බලතල හා ඉටු කරණු ලබන කාර්යයන්
• එම වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකා අංක III

- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ වාර්තාවක් සකස් කරන්න.
  - සාමාජිකත්වය
  - නිශේධ බලය හිමි වන අයුරු
  - බලතල හා ඉටු කරනු ලබන කාර්යයන්
- එම වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකා අංක IV

- එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ මණ්ඩලය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ වාර්තාවක් සකස් කරන්න.
  - සාමාජිකත්වය
  - බලතල හා ඉටු කරනු ලබන කාර්යයන්
- එම වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකා අංක V

- එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික අධිකරණය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ වාර්තාවක් සකස් කරන්න
  - විනිශ්චයකාරවරු පත් වන අයුරු
  - බලතල හා ඉටු කරනු ලබන කාර්යයන්
- එම වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකා අංක VI

- එක්සත් ජාතීන්ගේ භාරකාර මණ්ඩලය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ වාර්තාවක් සකස් කරන්න.
  - පිහිටු වීමේ අරමුණු
  - ඉටු කළ සේවා
- එම වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

**විවිධ සහය**

| | |
|---|---|
| සිම්ස්කා සුසිකෝ ජයවර්ධන | කළමනාකරණ සහකාර<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**පිටකවර නිර්මාණය**

| | |
|---|---|
| රවීන්ද්‍ර තේනුවර | කථිකාචාර්ය<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |